# (ඉ) රාජ්‍ය මූල්‍ය කටයුතු

## (අ) කොටස - 1966/67 මුදල් වර්ෂය

1966 ඔක්තෝබර් සිට 1967 සැප්තැම්බර් දක්වා වූ මුදල් වර්ෂය තුළ සිදු වූ රජයේ පිස්කල් කටයුතු පසුගිය මුදල් වර්ෂයන්හි මෙයට සමාන සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 1 සහ II (ඉ) 6 සංඛ්‍යා සටහන් මගින් සාරාංශ කොට ඇත. එහි දක්වා ඇති පරිදි 1966/67 මුදල් වර්ෂය තුළ වූ රජයේ පිස්කල් කටයුතුවල විශේෂ ලක්ෂණයන් පහත දක්වා ඇත.

(අ) 1965/66 යේ රුපියල් දශ ලක්ෂ 1,833·3 සහ 1964/65 රුපියල් දශ ලක්ෂ 1,816·4 හා සැසඳීමේදී, මුළු අයභාරය රුපියල් දශ ලක්ෂ 1,954·7 ක් විය.

(ආ) සම්මත වූ මුළු වැය[1] රුපියල් දශ ලක්ෂ 2,520·0 ක් වූ අතර මෙය 1965/66 දී වූ රුපියල් දශ ලක්ෂ 2,388·9 සහ 1964/65 රුපියල් දශ ලක්ෂ 2,274·6 හා සැසඳේ. මෙම මුළු වියදමෙන්, ආවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 1,895·3 ක් විය. මෙම වියදම් ප්‍රමාණය 1965/66 රුපියල් දශ ලක්ෂ 1,860·5 හා 1964/65 රුපියල් දශ ලක්ෂ 1,803·4 හා සැසඳේ. මේ අතර ප්‍රාග්ධන වැය සම්මත සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 624·7 ක්වූ අතර, එය 1965/66 දී, රුපියල් දශ ලක්ෂ 471·2 ක් විය.

(ඇ) අත්තිකාරම් ගිණුම්හි ගනුදෙනු වල ප්‍රතිඵලය වූයේ රුපියල් දශ ලක්ෂ 40·7 ක ශුද්ධ ගෙවීමකි. මෙය 1965/66 සහ 1964/66 දී පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 10·4 ක හා රුපි. දශලක්ෂ 27·8 ක වශයෙන් සිදු වූ ශුද්ධ ලැබීම මෙය හා සංසන්දනය වේ.

(ඈ) මෙම ගනුදෙනු හේතු කොට ගෙන උද්ගත වූ ශුද්ධ මුදල් හිඟය රුපියල් දශ ලක්ෂ 606·0 ක්වූ අතර, 1965/66 දී රුපියල් දශ ලක්ෂ 566·0 ක් ද, 1964/65 දී රුපියල් දශ ලක්ෂ 430·4 ක් ද විය.

(ඉ) 1966/67 ශුද්ධ මුදල් හිඟය පියවනු ලැබුවේ, දේශීය වෙළඳ පොළෙන් ගත් ණය වන රුපියල් දශ ලක්ෂ 348·3 ද, විදේශීය මාර්ග වලින් ගත් ණය වන රුපියල් දශ ලක්ෂ 228·6 ද, දේශීය වෙළඳ පොළෙන් බැහැර අනිකුත් මාර්ග වලින් ගත් ණය වන රුපියල් දශ ලක්ෂ 72·2 ද යෙදවීමෙනි.

(ඊ) එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය අරමුදල්වල වෙනස්වීම් වෙනුවෙන් ගැලපූ විට ශුද්ධ මුදල් හිඟය නිසා, ඇති වූ ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ, 55·2 ක් විය. මෙය 1965/66 දී වූ රුපියල්. දශ ලක්ෂ 122·4 ක් සහ 1964/65 දී වූ රුපියල් දශ ලක්ෂ 34·7 සමග සැසඳේ.

### අයභාරය

දෙවන පරිශිෂ්ටයේ 19 වැනි සංඛ්‍යා සටහනෙහි, 1966/67 සඳහා මුල් අයභාර ඇස්තමේන්තු සහ නියම (තාවකාලික) අයභාර එකතු කිරීම්, 1965/66 සඳහා වූ නියම අයභාර එකතු කිරීම් සමග රජයේ ඇස්තමේන්තු වල පෙනෙන ප්‍රධාන අයභාර ශීර්ෂ යටතේ දක්වා ඇත. 1966/67 රජයේ පිස්කල් කටයුතුවල සතුටුදායක ලක්ෂණයක් වනුයේ ඉකුත් මුදල් වර්ෂයේ එකතු කළ ආදායමට වඩා, මේ වර්ෂයේ ආදායමෙහි

---

1. II ඉ) I සංඛ්‍යා සටහනේ I (ආ) (I) සහ I (ආ) (II) යටතේ වූ එකතුය.

| | 1955/56 | 1956/57 | 1957/58 | 1958/59 | 1959/60 |
|---|---|---|---|---|---|
| **1.** ශුද්ධ මුදල් අතිරික්තය/හිඟය (—) .. | 1·2 | – 196·4 | – 222·3 | – 413·4 | – 417·5 |
| අ. ආදායම .. | 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 | 1,403·8 |
| ආ. වියදම (එනම්, ණය ගනුදෙනු වල ශුද්ධ ලැබීම හෝ ගෙවීම අත්හැර මුළු ගෙවීම්) .. | –1,258·4 | –1,456·9 | –1,502·3 | –1,743·8 (උ) | –1,821·3 |
| (1) ආවර්තන වියදම් (අ) (ආ)* .. | –1,014·4 | –1,105·2 | –1,280·1 | –1,432·2 | –1,511·9(ඌ) |
| (2) ප්‍රාග්ධන වියදම් (අ)* .. | – 211·0 | – 213·3 | – 282·6 | – 303·4 | – 306·6 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම් .. | – 4·0 | – 5·1 | – 3·0 | – 2·4 | – 1·5 |
| (4) නිකුත් නොකළ ගබඩා තොග හා උපකරණ (ඇ) .. | 1·2 | – 14·5 | – | 10·5 | – 7·1 |
| (5) රජයේ දෙපාර්තමේන්තුවලට අත්තිකාරම් (ඇ) .. (6) ලංකා–චීන වෙළෙඳ ගිණුම (ඇ) .. | – 30·3 | – 115·8 | 54·5 | – 17·1 | 5·8 |
| (7) විවිධ (ඇ) .. | 0·1 | – 3·0 | 8·9 | 0·8 | – |
| හිඟය පියවීම | | | | | |
| **2.** රාජ්‍ය ණය ගනුදෙනු වලින් උද්ගත වන (ශුද්ධ) ලැබීම් හා ගෙවීම්(–)සහ විදේශීය දීමනා ලැබීම් .. | 12·2 | 175·4 | 174·7 | 351·8 | 411·6 |
| අ. වෙළෙඳ පොළෙන් නොවන දේශීය ණය ගැනීම් හා ණය ගෙවීම්(විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළුව) .. | – 36·5 | – 9·4 | 72·5 | 27·6 | 57·4 |
| (1) පරිපාලන ණය ගැනීම් .. | – | – | – | – | 49·3 |
| (2) තැන්පතු (ඇ) .. | – 10·8 | 9·0 | 73·9 | 27·3 | 13·0 |
| (3) විවිධ අරමුදල් (ඉ) .. | – 4·8 | – 2·3 | 20·1 | 4·2 | 2·7 |
| (4) රජයේ ආයතන වලට හා රජයේ නිලධාරීන්ට ණය (ඊ) .. | – 20·9 | – 16·1 | – 21·5 | – 3·9 | – 7·6 |
| ආ. දේශීය වෙළෙඳ පොළේ ණය ගැණුම් හා ණය ආපසු ගෙවීම් .. | 47·0 | 169·7 | 81·9 | 294·6 | 330·5 |
| (1) රුපියල් ණය ., | 74·5 | 94·9 | 45·0 | 95·0 | 134·8 |
| (නිදන් අරමුදල් දායක දීමනා හැර) .. | 35·5 | 27·6 | 23·1 | 26·3 | 27·7 |
| | 39·0 | 67·3 | 21·9 | 68·7 | 107·1 |
| (2) භාණ්ඩාගාර බිල් .. | 8·0 | – 3·0 | 74·6 | 179·0 | 228·2 |
| (3) මහ බැංකු අත්තිකාරම් .. | – | 96·3 | – 13·8 | 41·1 | 3·1(ඌ) |
| (4) බදු සංචිත සහතික .. | – | 9·1 | – 0·8 | 5·8 | – 7·9 |
| ඇ. විදේශීය මුදල් .. | 1·7 | 15·1 | 20·3 | 29·6 | 23·7 |
| (1) ණය .. | 5·2 | 18·6 | 23·7 | 35·5 | 29·3 |
| (නිදන් අරමුදල් දායක දීමනා හා ආදය මෙන් ගෙවන සෘජු රාජ්‍ය ණය බේරීම් අත්හැර .. | 305 | 3·5 | 3·4 | 5·9 | 5·6 |
| | 1·7 | 15·1 | 20·3 | 29·6 | 23·7 |
| (2) භාණ්ඩ ණය .. | – | – | – | – | – |
| (නැවත ගෙවීම් හැර) .. | – | – | – | – | – |
| | – | – | – | – | – |
| (3) දීමනා .. | – | – | – | – | – |
| **3.** මුදල් ශේෂ හා ද්‍රව්‍යාධාර අරමුදල් වෙනස්වීම් .. | 11 0 | – 21·0 | – 47·5 | – 61·7 | – 6·0 |
| (1) මුදල් ශේෂ (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව) .. | 11·0 | – 21·0 | – 47·5 | – 61·7 | – 6·0 |
| (2) ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් .. | – | – | – | – | – |

(අ) 2 වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ (උ) අධෝ ලිපිය බලන්න.
ගත වූ මුදල් වර්ෂ වලදී වැය වූ, ණය කාර්‍යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම්ට මාරුකිරීමෙන් උද්ගත වන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොයැසදේ..

(ආ) නිදන් අරමුදල් දායක දීමනා හා ආදයමෙන් ගෙවන සෘජු රාජ්‍ය ණය බේරීම් අත්හැර ඇත. 2 (ආ) I, 2 (ඇ) II, සහ 2 (ඇ) I බලන්න.

(ඇ) මුදල් වර්ෂය අවසානයේ වූ වෙනස (ශුද්ධ) දක්වේ. ලංකා–චීන වෙළෙඳ ගිණුම පිළිබඳ විස්තර 1955/56 සිට 1960/61 දක්වා වූ වර්ෂ සඳහා වෙන වෙන ම ලබා ගැනීමට නොමැත.

(ඈ) නඩු කියන්නන්. කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන්, 1959/60 දක්වා වියදම් නොකොට ඉතිරි වී ඇති විදේශාධාර ඇතුළත් වේ.

(ඉ) වැන්දඹු අනත්කරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල යනාදිය.

(ඊ) මෙම ණය, කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනයට, ප්‍රාදේශීය ණය හා සංවර්ධන අරමුදලට, කාර්මික සංයුක්ත මණ්ඩල වලට, හා රජයේ නිලධාරීනට දෙන ලදී.

**සංඛ්‍යා සටහන II (ඉ) 1**

අතිරික්තය/හිඟය (—)

රුපියල් දශ ලක්ෂ

| 1960/61 | 1961/62 | 1962,63 | 1963/64 | 1964/65 | 1965/66 | 1966/67(ඔ) |
|---|---|---|---|---|---|---|
| – 462·5 | – 456·1 | – 391·7 | – 461·7 | – 430·4 | – 566·0 | – 606·0 |
| 1,513·9 | 1,620·6(ඒ) | 1,593·4(ඒ) | 1,759·0(ඒ) | 1,816·4(ඒ) | 1,833·3(ඒ) | 1,954·7(ඒ) |
| –1,976·4 | –2,076·6 | –1,985·3 | –2,220·7 | –2,246·8 | –2,399·3 | –2,560·7 |
| –1,540·8(ඌ) | –1,580·7(ඌ) | –1,596·4(ඌ) | –1,834·1(ඌ) | –1,803·4(ඌ) | –1,860·5(ඌ) | –1,895·3(ඌ) |
| – 419·9 | – 480·6 | – 402·3 | – 402·5 | – 471·2 | – 528·4 | – 624·7 |
| – 1·5 | – 0·7 | – 0·3 | – 0·2 | 0·1 | .... | .... |
| – 1·9 | 2·4 | – 8·6 | – 5·2 | 2·7 | – 15·5 | – 2·5 |
| – 15·9 | 10·2 | 7·6 | – 45·9 | 97·9 | 11·3 | – 55·0 |
| | – 26·0 | 20·3 | 61·0 | – 70·4 | – 6·6 | 15·1 |
| – 0·2 | – 1·2 | – 5·6 | 6·2 | – 2·3 | 0·4 | 1·7 |
| 462·5 | 496·3 | 391·3 | 416·3 | 410·9 | 648·4 | 629·1 |
| 29·4 | 104·5 | – 33·8 | – 1·9 | 50·3 | 112·2 | 72·2 |
| – 2·9 | 11·9 | – 0·4 | – 17·2 | – 8·6 | 41·7 | 40·5 |
| 39·4 | 86·5 | – 27·6 | 17·4 | 68·2 | 76·6 | 43·5 |
| – 1·0 | 4·8 | 0·1 | 2·5 | – 3·1 | 0·2 | – 1·4 |
| – 6·1 | 1·3 | – 5·9 | – 4·6 | – 6·2 | – 6·3 | – 10·4 |
| 409·4 | 338·9 | 333·1 | 322·8 | 260·9 | 418·2 | 348·3 |
| 214·9 | 145·0 | 205·0 | 245·0 | 253·1 | 325·0 | 340·0 |
| 29·2 | 35·0 | 38·9 | 44·6 | 51·2 | 58·9 | 67·5 |
| 185·7 | 110·0 | 166·1 | 200·4 | 201·9 | 266·1 | 272·5 |
| 198·4 | 248·0 | 124·1 | 128·4 | 50·5 | 124·3 | 75·3 |
| 20·6(ඌ) | – 21·0(ඌ) | 36·6(ඌ) | – 19·4(ඌ) | 8·3(ඌ) | 28·3(ඌ) | 7·0(ඌ) |
| 4·7 | 1·9 | 6·3 | 13·4 | 0·2 | – 0·5 | – 6·5 |
| 23·7 | 52·9 | 92·0 | 95·4 | 99·7 | 118·0 | 208·6 |
| 16·3 | 44·5 | 68·7 | 75·7 | 92·8 | 77·2 | 42·4 |
| | | | | | 35·9 | 44·9 |
| 5·9 | 9·7 | 7·8 | 12·2 | 17·2 | | |
| 10·4 | 34·8 | 60·9 | 63·5 | 75·6 | 41·3 | – 2·5 |
| – | – | – | – | – | 35·2 | 193·9 |
| – | – | – | – | – | – | 2·1 |
| – | – | – | – | – | 35·2 | 191·8 |
| 13·3 | 18·1 | 311·1 | 31·9 | 24·1 | 41·5 | 19·3 |
| ... | 40·2 | – 0·4 | – 45·4 | – 19·5 | 82·4 | 23·3 |
| | | | | | | – 20·6 |
| ... | 40·2 | – 0·4 | – 45·4 | – 19·5 | 47·2 | |
| – | – | – | – | – | 35·2 | 43·9 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

( උ ) 1954/55 ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 ක මුදලක්, අත්තිකාරම් ගිණුමේ සිට 1958/59 දී ආවර්තන වියදමට මාරු කරන ලදී. මේ පොත් ගැලපිල්ල, 1958/59 සංඛ්‍යාවන්ගෙන් ඉවත්කර තුබුනද, (සංලක්ෂ්‍යය බලන්න)* 1954/55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර ඇත.

(ඌ) ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන වලට ගෙවීමට තුබූ මුදල් බේරීම වස් මහ බැංකුවෙන් ලබාගත් විශේෂ ණය වලින් 1959/60 දී රුපියල් දශ ලක්ෂ 37·0 ක්ද, 1960/61 දී රුපියල් දශ ලක්ෂ 0·2 ක්ද, 1961/62, 1962/63 හා 1963/64 දී රුපියල් දශ ලක්ෂ 0·21 ක්ද, 1964/65 දී රුපියල් දශ ලක්ෂ 21·5 ක්ද, 1965/66 දී රුපියල් කෝටි 2·11 ක්ද 1966/67 දී රුපියල් දශ ලක්ෂ 2·0 ක්ද යන වශයෙන් ගෙවන ලද මුදල් ඇතුළත් නොවේ.

( එ ) 1960/61 සිට විදේශ දීමනා වලට අයවන ප්‍රාග්ධන වියදම් අයවැය ලේඛනයට ඇතුළත් කෙරිණ. 1960/61 ට පෙර, විදේශ දීමනා වලින් වියදම් නොකොට ඉතිරි වූ භාණ්ඩාගාරයේ අයවැය මුදල් මාර්ගයක්ව පැවැති, ශේෂ පමණක් තැන්පතු යටතේ ඇතුළත් කැරිණි.

( ඒ ) මෙම සටහනෙහි දී ඇති ඇදයම් සංඛ්‍යා රජයේ ගිණුම්හි දක්වා ඇති ඒවායින් වෙනස්වේ. 2 වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනෙහි (ආ) අධෝ ලිපිය බලන්න.

( ඔ ) තාවකාලිකයි.

## සංඛ්‍යා සටහන II (ඉ) 2

## රජයේ අයභාරය

| | මුල් ඇස්තමේන්තු 1966/67 | | නියම (තාවකාලික) 1966/67 | | නියම 1965/66 | | 1965/66 ට වඩා 1966/67 වෙනස (නියම තාවකාලික) | 1966/67 මුල් ඇස්ත මේන්තු හා සසඳන කල 1966/67 (නියම, තාවකා ලික අධිකය හෝ අඩුවීම (–) |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශ ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශ ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශ ලක්ෂ | ප්‍රතිශතය | | |
| 1. ආනයන බදු අතුරින් (අ) .. .. .. | 611·0 | 30·1 | 544·3 | 27·8 | 476·8 | 26·0 | 67·5 | —66·7 |
| (අ ) කපු නූල් කැරලි හා රෙදි .. .. | 50·0 | 2·5 | 43·9 | 2·2 | 36·2 | 2·0 | 7·7 | — 6·1 |
| (ආ) ධාන්‍ය හා පිටි .. .. .. | 21·0 | 1·0 | 30·0 | 1·5 | 19·2 | 1·0 | 10·8 | 9·0 |
| (ඇ) භූමිතෙල් මෝටර් ස්ප්‍රිතු ආදිය .. .. | 160·0 | 7·9 | 173·7 | 8·9 | 127·0 | 6·9 | 46·7 | 13·7 |
| (ඈ) දුම්කොළ හා සිගැරට් .. .. | 30·0 | 1·5 | 28·1 | 1·4 | 28·8 | 1·6 | — 0·7 | — 1·9 |
| (ඉ ) සීනි .. .. .. | 30·0 | 1·5 | 26·2 | 1·3 | 32·7 | 1·8 | — 6·5 | — 3·8 |
| (ඊ ) ප්‍රවාහණ උපකරණ .. .. .. | 55·0 | 2·7 | 49·2 | 2·5 | 43·5 | 2·4 | 5·7 | — 5·8 |
| (උ ) අනිකුත් භාණ්ඩ (ආ) .. .. | 219·0 | 10·8 | 140·4 | 7·2 | 157·5 | 8·6 | —17·1 | —78·6 |
| (ඌ) ආනයනයන්හි බලපත්‍ර ගාස්තු (ඇ) .. .. | 23·0 | 1·1 | 34·4 | 1·8 | 13·1 | 0·7 | 21·3 | 11·4 |
| 2. අපනයන බදු (ඈ) .. .. .. | 306·0 | 15·1 | 230·1 | 11·8 | 255·8 | 14·0 | —25·7 | —75·9 |
| (අ ) (තේ බද්ද ඇතුළුව) (ඈ) .. .. | 226·0 | 11·1 | 205·2 | 10·5 | 202·4 | 11·0 | 2·8 | —20·8 |
| (ආ) රබර් .. .. .. | 21·0 | 1·0 | – 1·5 (ඉ) | —0·1 | 17·0 | 0·9 | —18·5 | —22·5 |
| (ඇ) පොල් .. .. .. | 52·7 | 2·6 | 19·9 | 1·0 | 31·1 | 1·7 | —11·2 | —32·8 |
| 3. දේශීය භාණ්ඩ බදු අතුරින් (ඈ) .. .. | 344·3 | 16·9 | 354·9 | 18·2 | 318·2 | 17·4 | 36·7 | 10·6 |
| (අ ) අරක්කු වලින් ලැබුන ලාභය .. .. | 106·0 | 5·2 | 106·8 | 5·5 | 118·0 | 6·4 | —11·2 | 0·8 |
| (ආ) රටෙහි නිපැයුන මත් ද්‍රව්‍ය වෙනුවෙන් පැන වූ බදු .. | 13·2 | 0·6 | 12·7 | 0·6 | 14·7 | 0·8 | — 2·0 | — 0·5 |
| (ඇ) දුම්කොළ බද්ද .. .. .. | 132·0 | 6·5 | 138·8 | 7·1 | 120·0 | 6·5 | 18·8 | 6·8 |
| (ඈ) පිරිවැටුම් බද්ද .. .. .. | 66·0 | 3·2 | 72·2 | 3·7 | 39·1 | 2·1 | 33·1 | 6·2 |
| 4. ආදායම් බදු .. .. .. | 260·0 | 12·8 | 310·0 | 15·9 | 275·4 | 18·0 | 34·6 | 50·0 |
| 5. මුදල් බදු .. .. .. | 9·0 | 0·4 | 8·8 | 0·5 | 10·6 | 0·6 | — 1·8 | — 0·2 |
| 6. පුද්ගලික බදු .. .. .. | 20·0 | 1·0 | 13·1 | 0·7 | 12·0 | 0·7 | 1·1 | — 6·9 |
| 7. ජාතික ලොතරැයි .. .. .. | 12·0 | 0·6 | 11·9 | 0·6 | 9·5 | 0·5 | 2·4 | — 0·1 |
| 8. රජයේ ව්‍යාපාරවල දළ ලැබීම් අතුරින් .. .. | 259·8 | 12·8 | 250·3 | 12·8 | 247·5 | 13·5 | 2·8 | — 9·5 |
| (අ ) දුම්රිය ආදායම .. .. .. | 101·5 | 5·0 | 102·1 | 5·2 | 99·9 | 5·4 | 2·2 | 0·6 |
| (ආ) විදුලිබල දෙපාර්තමේන්තුවේ ආදායම .. .. | 64·2 | 3·2 | 55·9 | 2·9 | 50·7 | 2·8 | 5·2 | — 8·3 |
| (ඇ) තැපැල් හා විදුලි පණිවුඩ ආදායම .. .. | 57·1 | 2·8 | 56·9 | 2·9 | 54·8 | 3·0 | 2·1 | — 0·2 |
| (ඈ) වරාය හා හාබර් .. .. .. | 28·5 | 1·4 | 33·8 | 1·7 | 33·8 | 1·8 | — | 5·3 |
| 9. අනෙකුත් ආදායම් .. .. .. | 210·9 | 10·4 | 231·3 | 11·8 | 227·5 | 12·4 | 3·8 | 20·4 |
| එකතුව .. | 2,033·0 | 100·0 | 1,954·7 (උ) | 100·0 | 1,833·3 (උ) | 100·0 | 121·4 | —78·3 |

(අ ) බලපත්‍ර යටතේ එන ආනයන බලපත්‍ර ගාස්තු ද ඇතුළත් වේ.
(ආ) රජයේ ආදායම් වර්ගීකරණයේ පෙන්වා දී ඇති ශීර්ෂයකි.
(ඇ) බලපත්‍ර යටතේ ඇත්තා වූ.
(ඈ) උපශීර්ෂ 3 යටතේ වර්ගකර ඇති තේ බදු හා ආදායම් ඇතුළත් – 1 වැනි ශීර්ෂය – රේගු යටතේ විවිධ භාණ්ඩ.
(ඉ) මේ ශීර්ෂය යටතේ ඇති සෘණ ප්‍රමාණයට හේතුව ආදායම් වලින් ලැබුණු ආපසු ලැබීමය
(උ) රජයේ ආදායම් වර්ගීකරණයෙහි භාණ්ඩ බදු ආදායම් යටතේ වර්ග කර ඇති තේ බද්ද මින් ඉවත් වේ.
(ඌ) II පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනෙහි (ආ) පාද සටහනෙහි දක්වා ඇති හේතූන් නිසා, මෙම ආදායම් සංඛ්‍යා රජයේ ප්‍රකාශිත ගිණුම්හි සංඛ්‍යාවන්ගෙන් වෙනස් වේ.

පැහැදිලි වැඩි වීමක් දක්නට තිබීමය. රුපියල් දශ ලක්ෂ 1,954·7 ක්වූ 1966/67 නියම (තාවකාලික) අයභාරය 1965/66 අනුරූප ප්‍රමාණයට (රුපියල් දශ ලක්ෂ 1,833·3) වඩා රුපියල් දශ ලක්ෂ 121·4 කින් හෙවත් සියයට 6·6 කින් වැඩි විය.

1956/57 සිට 1966/67 දක්වා වූ දශ අවුරුද්දක කාලඡෙදය තුළදී, අයභාරය, වාර්ෂිකව සියයට 4 කින් (සංයුක්ත) වැඩි වී ඇත. මේ අනුව, 1966/67 රජයේ ආදායම් තත්ත්වය, පසුගිය අවුරුදු 5 තුළ වූ සාමාන්‍ය වාර්ෂික වැඩිවීමට වඩා වැඩි වූ අතර, 1966 වාර්තාවෙහි දක්වූ 1965/66 මුදල් වර්ෂයේ රජයේ ආදායම් තත්ත්වයට වඩා පැහැදිලි අන්දමින් වෙනස් විය. එම වර්ෂයේ අයභාරය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 16·8 කින් හෙවත් සියයට 0·9 කින් ය.

ඒකජන ආදායම 1965/66 දී පහළ වැටීමක් පෙන්නුම් කළ අතර, 1966/67 මුදල් වර්ෂයේ දී පැහැදිලි අන්දමින් ඉහළ ගියේය. මෙම වැඩිවීම 1964/65 න් අවසන් වූ මුදල් වර්ෂ 5 තුළදී අත්දුටු ඒකජන ආදායමෙහි වැඩිවන උපනතිය නැවත පිහිටුවනු ලැබීය. 1964/65 දී රුපියල් 162 ක්වූ ආදායම (ඒකජන) 1965/66 දී රුපියල් 160 ට පහළ බැස, 1966/67 දී රුපියල් 166 දක්වා ඉහළ ගියේය.

මුල් ඇස්තමේන්තුව වූ රුපියල් දශ ලක්ෂ 2,033·0 හා සසඳන විට, 1966/67 එකතු කරන ලද (තාවකාලික) නියම අයභාරයෙහි රුපියල් දශ ලක්ෂ 78·3 ක අඩුවක් පෙන්නුම් කළේය. 1965/66 මේ කාලය සඳහා අයභාරයෙහි අධි-ඇස්තමේන්තු කිරීම රුපියල් දශ ලක්ෂ 64·6 ක් විය. 1964/65 දී එය රුපියල් දශ ලක්ෂ 4·9 ක්වූ අතර. 1963/64 දී රුපියල් දශ ලක්ෂ 28·6 ක් විය. II (ඉ) 2 සංඛ්‍යා සටහනින් 1966/67 ප්‍රධාන අයභාර ශීර්ෂ යටතේ ලැබුණු නියම අයභාරයන්හි (තාවකාලික) ඇති වූ වැදගත් වෙනස්වීම් සවිස්තරව දක්වා ඇති අතර, 1965/66 නියම අයභාර හා 1966/67 මුල් ඇස්තමේන්තු සමග සසඳා ඇත.

1966/67 වර්ෂයේ දී ආනයන වලින් ලද ආදායම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 675 කින් වැඩි විය. බලපත්‍ර යටතට පත්කළ ආනයන වලින් ලද බලපත්‍ර ගාස්තු (රුපියල් දශ ලක්ෂ 21·3), මෝටර් ස්ප්‍රිතු සහ ද්‍රව ඉන්ධන වලින් ලද තීරු බදු (රුපියල් දශ ලක්ෂ 46·7), ධාන්‍ය වර්ග සහ පිටි වලින් ලද තීරු බදු (රුපියල් දශ ලක්ෂ 10·8) ආදියෙන් ලද ආදායමෙහි වැඩිවීම, රුපියල් දශ ලක්ෂ 78·8 ක් විය. සීනි (රුපියල් දශ ලක්ෂ 6·5) සහ "අනෙකුත් භාණ්ඩ" (රුපියල් දශ ලක්ෂ 17·1) වලින් ලද තීරු බදු ආදායම පහළ වැටුණද, මෙම වැඩිවීම තරමක් දුරට මැකී ගියේ ය. බලපත්‍ර ගාස්තු වශයෙන් වැඩි ආදායමක් ලැබීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ බලපත්‍ර යටතට පත් කළ භාණ්ඩයන්ගේ ආනයන ප්‍රමාණය වැඩිවීම 1967 ජූලි 25 වැනි දින පවත්වන ලද 1967/68 වර්ෂයේ අයවැය කථාවේ දී යෝජනා කළ පරිදි, ආනයන කරන සියළුම රෙදිපිළි වලට සියයට 10 ක බලපත්‍ර ගාස්තුවක් පැනවීම සහ වෙනත් ආනයන ද්‍රව්‍ය කිහිපයක් වෙනුවෙන් එදිනට පැවති බලපත්‍ර ගාස්තුව සියයට 10 කින් වැඩි කිරීමය. මෝටර් ස්ප්‍රිතු, ද්‍රව ඉන්ධන, සහ පිටි වලින් ලද තීරුබදු ආදායමෙහි වැඩිවීමට හේතු වූයේ ඒවායේ ආනයන ප්‍රමාණයෙහි වැඩි වීමයි. හාල්, සීනි සහ "අනෙකුත් භාණ්ඩ" වලින් එකතු වූ තීරු බදු එම ද්‍රව්‍යයන්ගේ ආනයන ප්‍රමාණයේ අඩුවීම හේතු කොට ගෙන පහළ වැටුනි.

ආනයන වලින් ලැබූ අයභාරය වැඩිවීමට තියුණු ප්‍රතිවිරුද්ධයක් ලෙස 1966/67 තුළදී අපනයන බදු වලින් ලැබූ අයභාරය, 1965/66 හා සසඳ බැලීමේදී රුපි. දශ ලක්ෂ 25·7 ක් (සියයට 10) තරම් විශාල ප්‍රමාණයකින් පහළ වැටීමක් පෙන්විය. රුපියල් දශ ලක්ෂ 2·8 ක සුළු ප්‍රමාණයකින් ඉහළ ගිය තේ හා සම්බන්ධයෙන් එකතු කළ

ආදායම්[1] හැරෙන්නට, රබර් සහ පොල් ද්‍රව්‍ය වෙනුවෙන් බදු එකතු කිරීම් ප්‍රමාණය පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 18·5 කින් හා රුපි. දශ ලක්ෂ 11·2 කින්, ඉතා සීඝ්‍ර ලෙස පහළ බැසීය. ආනයන ගාස්තු (නියමිත) යටතේ, තේ වලින් එකතු කළ ආදායම් ප්‍රමාණය, රුපියල් දශලක්ෂ 7·6 කින් අඩුවී රුපියල් දශ ලක්ෂ 158·0 දක්වා පහළ වැටුනේ තේරාත්තල් දශ ලක්ෂ 22·3 කින් තේ පරිමාව සංකෝචනය වීම නිසාය.[2] මේ අනුව, තේ වෙනුවෙන් එකතු කළ අයබදු වල වැඩිවීමක් ඇතිවූයේ වටිනාකම අනුව අය කළ තේ බද්ද, රුපියල් දශ ලක්ෂ 10·4 කින් ඉහළ යාම හේතු කොට ගෙනය

අපනයනය කළ පරිමාවෙහි ඉහළ යාමක් තිබුණ ද, රබර් අපනයන වලින් රැස් කළ බදුවල පහළ වැටීමක් ඇති වූයේ නැ. වි. ස. මිල[3] අඩුවීමේ හේතු වෙනි. සෑම ශ්‍රේණියකම රබර් රාත්තලකට ම සාමාන්‍ය නැ. වි. ස. මිල රුපියල් 1·04 දක්වා, ශත 11 කින් (සියයට 10) තියුණු අන්දමින් පහළ වැටුණි. ඉකුත් මුදල් වර්ෂයන් දෙක තුළදී ඉහළ ගිය අපනයන පරිමාව, සලකා බලන මුදල් වර්ෂයේ දී, රාත්තල් දශලක්ෂ 306·6 දක්වා, රාත්තල් දශ ලක්ෂ 26·8 කින් තවදුරටත් ඉහළ ගියේය.

පොල් ද්‍රව්‍ය වලින් ලැබුණු අපනයන බදු අයභාරය රුපියල් දශ ලක්ෂ 11·2 කින් (සියයට 36) පහළ වැටීමට හේතුව ප්‍රධාන ත්‍රිවිධ පොල් නිෂ්පාදිතයන් වෙනුවෙන් ම එකතු කළ බදු ප්‍රමාණය පිරිහීමය. කොප්පරා වෙනුවෙන් වූ තීරු බදු එකතුව රුපියල් දශ ලක්ෂ 3·3 කින් පහළ වැටුණු අතර, 1965/66 තීරු බදු එකතුව, සැසඳීමේ පොල් තෙල් හා කපාපු පොල් නිර්යාතයන් හා සම්බන්ධ තීරු බදු එකතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5·0 කින් සහ රුපියල් දශ ලක්ෂ 2·8 කින් පහළ වැටුනි. කොප්පරා සහ කපාපු පොල් වලින් ලැබුණු තීරු බදු එකතු වල අඩු වීමක් ඇති වූයේ, මිලෙහි හා අපනයන පරිමාව[4] යන දෙකොටසෙහිම පහළ වැටීම නිසාය. පොල් තෙල් අපනයන වලින් ලැබුණු තීරු බදු එකතු අඩු වූයේ, සලකා බලන මෙම මුදල් වර්ෂය තුළදී ඇති වූ අපනයන පරිමාවෙහි සුළු වැඩිවීම උවමනාවටත් වැඩියෙන් හිලව් වී යන පරිදි, මිල මට්ටම, පහළ වැටීමේ හේතු වෙනි. පොල් තෙල් අපනයනය ටොන් 2·2 කින් වැඩි වූ අතර,[5] කොප්පරා සහ කපාපු පොල් අපනයන පරිමාව, පිළිවෙලින්, ටොන් 7·7 දහසකින්[6] සහ ටොන් 1·3 කින් අඩු විය. පොල් නිෂ්පාදිත තුනෙහිම මිල උපනතීන් දිරි ගන්වන සුළු නොවීය. කොප්පරා වල නැ. වි. ස. මිල හොණ්ඩරය රු. 1·99 කින් පහල වැටුනුඅතර, කපාපු පොල් මිල හොණ්ඩරය රු , 10·65 කින් සහ පොල් තෙල් මිල හොණ්ඩරය රු. 11·16 ක් තරම් ප්‍රමාණයකින් පහළ බැස්සේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉකුත් වර්ෂයේ දී ද පහළ වැටුනු පොල් නිෂ්පාදිත තෙවර්ගයේ ම (නැ. වි. ස.) හොණ්ඩරයක සාමාන්‍ය මිල රු. 62·47 දක්වා, රු. 8·96 කින් (හෙවත් සියයට 13 කින්) තවත් පහළ වැටුණි.

අරක්කු විකිණීමෙන් ලැබුණු ලාභ සහ මෙරට මත් ද්‍රව්‍ය වලින් එකතුකළ බදු මගින් එකතු කළ අයභාර ඉකුත් මුදල් වර්ෂ පහ තුළදී ඉහල යන උපනතීන් පෙන්නුම් කළේය. සලකා බලන මුදල් වර්ෂයේ දී එය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 11·2 කින් සහ රුපියල් දශලක්ෂ 2·0 කින් පහළ වැටුණි. 1965/66 මුදල් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 103·0 ක් වූ නියම එකතු කිරීම් සහ පසුගිය ලාභ වලින් අතිරේක වශයෙන් රුපියල් දශ ලක්ෂ 15·0 ක් එම වර්ෂයේ අයභාරයට බැර කිරීමෙන්, මෙම පහල වැටීම විස්තර වේ. 1966/67 අයභාරයර බැර කළ ලාභය එම වර්ෂයේ පමණක් ලැබීම පෙන්වයි. දෙවනු කී වර්ගයේ මත් ද්‍රව්‍ය වලින් ආදායම පහළ වැටුනේ එම වර්ගයේ මත් ද්‍රව්‍ය විකුණුම් පරිමාව අඩුවීමේ හේතුවෙනි.

---

1. තේ බද්ද ඇතුළුවය.
2. 1966/67 තේ අපනයනය රාත්තල් දශලක්ෂ 452·2 ක්වූ අතර, 1965/66 දී රාත්තල් දශලක්ෂ 474·5 ක් විය.
3. රබර් හා සම්බන්ධ අපනයන තීරු බදු පදනම් වී ඇත්තේ අනුක්‍රම පරිමාණය අනුවය.
4. පොල් නිෂ්පාදිත හා සම්බන්ධ තීරු බදු පදනම් වී ඇත්තේ අනුක්‍රම පරිමාණය අනුවය.
5. 1965/66 දි පොල් තෙල් අපනයනය ටොන් 69·9 දහසක් වූ අතර, මෙය 1966/67 දී ටොන් 72·1 දහස හා සැසඳේ.
6. 1965/66 කොප්පරා අපනයනය ටොන් 26·3 දහසක් වූ අතර, මෙය, 1966/67 ටොන් 18·7 දහස හා සැසඳේ.

අපනයන තීරු බදු වලින් සහ මත් ද්‍රව්‍ය බදු වලින් ලැබුණු අයභාර අඩුවීමට ප්‍රතිවිරුද්ධ ලෙස දුම් කොළ බද්දෙන් සහ පිරිවැටුම් බද්දෙන් එකතු කළ අයභාරය තවදුරටත් වැඩි වුණි. දුම්කොළ බද්දෙන් ලැබුණු අයභාරය රුපියල් දශ ලක්ෂ 10·8 කින් (සියයට 16) ඉහළ ගිය අතර, මෙය සිගරැට් දුම්කොළ විකිණීම ඉහළ යාම සහ දුම්කොළ බද්ද, රාත්තලකට රු. 4·50 කින් ඉහළ යාම නිසා ය. 1965 සහ 1966 වාර්ෂික වාර්තා මගින්, මෑත අවුරුදු වලදී දුම් කොළ බද්දෙන් එකතු කළ ආදායම පැහැදිලි අන්දමින් ඉහළ ගිය බව පෙන්වා දෙනු ලැබීය. මේ සම්බන්ධයෙන්, 1961/62 සිට 1966/67 දක්වා වූ අවුරුදු 5 ක කාලපේදය තුළදී, දුම්කොළ බද්දේ අයභාරය වාර්ෂිකව සියයට 17 කින් (සංයුක්ත) ඉහළ යාම, සැලකිය යුතු කරුණකි.

1964/65 දී 34·8 ක්ද, 1965/66 දී රුපියල් දශ ලක්ෂ 39·1 ක්ද වූ පිරිවැටුම් බද්දේ අයභාරය රුපියල් දශ ලක්ෂ 33·1 කින් ඉහළ යමින්, සලකා බලන මුදල් වර්ෂයේ මුළු අයභාරයෙන් රුපියල් දශ ලක්ෂ 72·2 ක් හෙවත්, සියයට 4 ක් එකතු කරනු ලැබීය. මෙම වැඩි වීමට හේතු වූයේ, 1966 ජූලි මාසයේ දී, ව්‍යාපාර පිරිවැටුම් බද්දෙහි අනුපාතිකයන් ඉහළ නැංවීම සහ සියයට 5  හේ ඉහළ අනුපාතිකය යටතට එන භාණ්ඩ පිරිවැටුම ද ඉහළ යාමය. 1963 ඔක්තෝබරයේදී හඳුන්වා දුන් මෙම බද්දෙහි ආදායම් ලැබීමේ හැකියාව පිළිබඳව, අවධාරණයෙන් කරුණු දැක්වීම මෙහිදී සුදුසු ය. අපනයන තීරු බදු නො නැවතී අඩුවීම සහ පසුගිය දස වර්ෂ කාලපේදයක් තුළදී ආර්ථික ව්‍යුහයෙහි සිදු වී ඇති වෙනස්වීම නිසා මෙම තීරු බද්ද වඩා දක්ෂ අන්දමින් ප්‍රයෝජනයට ගැනීමෙන් අනාගත අවුරුදු වලදී එමගින් රජයට වඩා පහසු ආදායම් මාර්ගයක් ඇති කර ගත හැකිය.

1966/67 දී ආදායම් බදු ලැබීම්[4] රුපියල් දශ ලක්ෂ 310·0 දක්වා රුපියල් දශ ලක්ෂ 34·6 කින් ඉහළ ගියේය. මෙසේ ආදායම් ඉහළ යාමට හේතු වූයේ, වඩාත් හොඳට ආදායම තක්සේරු කිරීමත් ප්‍රාදේශීය කාර්යාල මගින් කළ තියුණු පරීක්ෂණ මගින් බදු මග හැරීම අඩු කිරීමත්, සහ තව බදු ගෙවන්නන් ලියා පදිංචි කිරීමත්ය. තවද, පුද්ගලික බදු එකතු කිරීම් වැඩිවීම, කලින් අවුරුදු වලදී තක්සේරු නොකිරීමෙන් නො ගෙවා තිබෙන බදු ක්‍රමයෙන් අඩු කිරීම ද හේතු විය.

1966/67 දී වෙනස්කම් දක් වූ අනිත් වැදගත් ශීර්ෂ දෙක වූයේ ජාතික ලොතරැයිය සහ වාණිජ ව්‍යාපාරයන්ගෙන්[5] ලැබූ ආදායම්ය. ජාතික ලොතරැයියේ ලැබීම් රුපියල් දශ ලක්ෂ 2·4 කින් වැඩි වූ අතර, වාණිජ ව්‍යාපාරයන්ගේ දළ ලැබීම් රුපියල් දශ ලක්ෂ 250·3 දක්වා සියයට 2·8 කින් ඉහළ ගියේ, මුදල් වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව සංයුක්ත මණ්ඩලයක් බවට[6] පරිවර්තනය වීම නිසා, ගුවන් විදුලි ප්‍රචාරය මගින් ලද ලාභ වලින් කොටසක් ඉවත් කිරීමක් ද සිදු වෙද්දීය. විමර්ශනයට භාජනය වන මුදල් වර්ෂය තුළදී, විදුලි බල සහ දුම්රිය දෙපාර්තමේන්තු වල ලැබීම්, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5·2 සහ රුපියල් දශ ලක්ෂ 2·2 කින් වැඩිවීම වැදගති.

---

1. 1965/66 කපාපු පොල් අපනයනය ටොන් 47·6 දහසක් වූ අතර, මෙය 1966/67 ටොන් 46·3 දහස හා සැසඳේ.
2. විදේශීය මත් ද්‍රව්‍ය වර්ගයේ, එනම් – බීර, ජින්, බ්‍රැන්ඩි සහ රම්.
3. මෙම ඉහළ යාම ක්‍රියාත්මක වූයේ 1967 ජූලි 26 වැනිද ය. (නො. 14,758/6 දරන 67.7.25 ගැසට් පත්‍රය) මෙම වැඩි වීමෙන් කොටසක් 1966/67 ආදායම් එකතුවට උපඩින කෙරුනි.
4. ආදායම් බදුවල අම්තර අයකිරිම හැර
5. දුම්රිය, විදුලි බල, තැපැල් හා විදුලි පණිවුඩ, ගුවන් විදුලි ප්‍රචාරය හා වරාය කොමිසමෙන් ලැබීම් වලින් සැකසේ.
6. 1967 ජනවාරි 5 වැනි දින.

**වියදම**

1955/56 සිට 1966/67 දක්වා කාලච්ඡේදය සඳහා රජයේ මුළු වියදම,[1] වර්තන වැය සම්මත (වැය සම්මත 1, 2, 4 සහ 6) සහ ප්‍රාග්ධන වැය සම්මත (වැය සම්මත 3, 5 සහ 7) වශයෙන් වර්ග කොට, II (ඉ) 3 සංඛ්‍යා සටහනෙන් දැක්වේ. අතිරේක ගිණුම් කටයුතු වලින් කෙරෙන වියදම් රජයේ වර්තන වියදම්,[2] ප්‍රාග්ධන වියදම්[3] සහ රජයේ මුළු වියදම වෙනුවෙන් ගලපා, වාර්ෂික කාලශ්‍රේණියක් වශයෙන් ද මෙම සංඛ්‍යා සටහනෙන් නිරූපනය කොට ඇත.

දැනට ලබාගත හැකි තාවකාලික සංඛ්‍යා අනුව බලන විට, 1966/67 දී රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 2,520·0 ක් විය. මෙය ඉකුත් මුදල් වර්ෂ වලට වඩා රුපියල් දශ ලක්ෂ 131·1 කින් (හෙවත්, සියයට 5·5 කින්) වැඩි වූ අතර, 1965/66 දී වැඩිවීම වූයේ රුපියල් දශ ලක්ෂ 114·3 කින් හෙවත්, සියයට 5·0 කිනි. එසේ වුවද, මෙම වැඩිවීම 1965/66 න් අවසන් වන දශකය තුළදී ඇති වූ වියදමෙහි වෘද්ධිය වූ සියයට 6·9 ක වාර්ෂික අනුපාතයට වඩා අඩු ය.

1966/67 ඇති වූ රුපියල් දශ ලක්ෂ 131·1 ක වැඩිවීම ආවර්තන සහ ප්‍රාග්ධන වියදම් වල ඇති වූ වැඩිවීම් වල ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ආවර්තන වියදම් ප්‍රමාණය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 34·8 කින් (හෙවත් සියයට 2 කින්) පමණක් වන අතර 1966/67 රජයේ මුදල් පරිහරණයේ දක්නට තිබූ වඩාත් සතුටුදායක ලක්ෂණය වූයේ ප්‍රාග්ධන වැය සම්මතයට වැටෙන මුළු වියදම රුපියල් දශ ලක්ෂ 96·3 ක් තරම් ප්‍රමාණයකින් (සියයට 18 කින්) වැඩි කොට රුපියල් දශ ලක්ෂ 624·7 දක්වා වූ ඉහළ නැංවීමය. මෙය සෑම මුදල් වර්ෂයකට වඩා උපරිම මුදුන් පමුණුවා ගැන්මකි.

1966/67[1] සඳහා මුලින් ඇස්තමේන්තු කරන ලද වැය සම්මත, මේ වර්ෂයෙහි නියම (තාවකාලික) වියදම සමග සසඳන විට, නියම වියදම රුපියල් දශ ලක්ෂ 214·7 ක අඩුවීමක් දැක්වීය. මීට හේතු වූයේ ප්‍රාග්ධන වැය සම්මතයෙහි රුපියල් දශ ලක්ෂ 137·0 (සියයට 18) සහ ආවර්තන වැය සම්මතයෙහි රුපියල් දශ ලක්ෂ 77·7 ක (සියයට 4 ක) ඌන වියදම් ඇතිවීමය. 1965/66 දී, නියම ආවර්තන වියදම, ඇස්තමේන්තු කළාට වඩා සියයට 2 කින් ඉක්මවීය.

**වර්තන වියදම්**

II (ඉ) 3 සංඛ්‍යා සටහන අනුව, 1966/67 නියම (තාවකාලික) වර්තන වියදම 1965/66 වර්තන වියදමට වඩා ඉහළ ගියේ, රුපියල් දශ ලක්ෂ 26·5 කින් (හෙවත් සියයට 2 කින්) පමණි. එම වර්ෂයේ වර්තන වියදම සියයට 4 කින් ඉහළ ගියේය. 1966/67 වැඩිවීම් අනුපාතිකය ද 1955/56 සිට 1965/66 දක්වා දශකය තුළ දක්නට තිබුණු සියයට 8 ක වාර්ෂික වැඩිවීමේ අනුපාතිකයට වඩා බොහෝ සෙයින් අඩු ය.

---

1. නිදහස් අරමුදල්, දයක මුදල් සහ රාජ්‍ය ණය ආදායමින් කළ සෘජු යලි ගෙවීම.

2. ආවර්තන වැය සම්මතවල ඇතුළත් වන ප්‍රාග්ධන ශීර්ෂ, අඩු කිරීමෙන් පසුව.

3. ආවර්තන වැය සම්මතවල ඇති ප්‍රාග්ධන ශීර්ෂ, ජාතික සංවර්ධන සංචිතය සම්බන්ධ වියදම් සහ ප්‍රාග්ධන වැය සම්මත වලට සම්බන්ධ වියදම් ඇතුළුව.

# සංඛ්‍යා සටහන II (ඉ) 3

## රජයේ වියදම

රුපියල් දශ ලක්ෂ

| | ආවර්තන වැය සම්මතවලට අයවන වියදම | | | ප්‍රාග්ධන වැය සම්මතවලට අයවන වියදම | වැය සම්මත වලට ඇතුළත් මුළු වියදම (v) = (iii) + (iv) | ජාතික සංවර්ධන සංචිතයට අයවන වියදම් | මුළු ප්‍රාග්ධන වියදම (ඉ) (vii) = (ii) + (iv) + (vi) | | | | | | අත්තිකාරම් ගනුදෙනු සඳහා වූ ශුද්ධ ලැබීම් (–) හෝ ගෙවීම් (ඊ) | මුළු වියදම (උ) (ix) = (v) + (vi) + (viii) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | මූර්ත වත්කම් අත්කර ගැනීම නිර්මාණය හා පවත්වාගෙනයාම | | | මූල්‍ය වත්කම් අත්කර ගැනීම | | | | |
| | වර්තන වියදම් (අ) | ආවර්තන වැය සම්මත වල ප්‍රාග්ධන ශීර්ෂ | එකතුව (ඇ) | (ඈ) | | | රජයේ සංස්ථා වලට හා නියෝජිත ආයතන වලට දුන් දීමනා | දේශිය බල මණ්ඩල වලට දුන් දීමනා | මධ්‍යම ආණ්ඩුවේ ප්‍රාග්ධන සම්පාදනය | රජයේ සංස්ථා වලට දුන් ණය | දේශිය බලමණ්ඩල වලට දුන් ණය | එකතුව | | |
| | (i) | (ii) | (iii) | (iv) | (v) | (vi) | | | | | | | (viii) | (ix) |
| 1955/56 | 862·8 | 151·6 | 1,014·4 | 211·0 | 1,225·4 | 4·0 | 51·7 | 12·6 | 273·1 | 26·2 | 3·0 | 366·6 | 29·0 | 1·258·4 |
| 1956/57 | 976·7 | 128·5 | 1,105·2 | 213·3 | 1,318·5 | 5·1 | 51·4 | 10·7 | 269·1 | 13·1 | 2·0 | 346·9 | 133·3 | 1·456·9 |
| 1957/58 | 1,118·2 | 161·9 | 1,280·1 | 282·6 | 1,562·7 | 3·0 | 91·3 | 12·1 | 289·3 | 52·8 | 2·0 | 447·5 | – 63·4 | 1·502·3 |
| 1958/59 | 1,274·4 | 157·8 | 1,432·2 | 303·4 | 1,735·6 | 2·4 | 76·6 | 9·4 | 331·7 | 45·9 | – | 463·6 | 5·8 | 1,743·8 |
| 1959/60 | 1,365·4 | 146·5 | 1,511·9 | 306·6 | 1,818·5 | 1·5 | 86·5 | 9·6 | 310·5 | 48·0 | – | 454·6 | 1·3 | 1,821·3 |
| 1960/61 | 1,471·3 | 69·5(ආ) | 1,540·8 | 419·9 | 1,960·7 | 1·5 | 115·0 | 8·1 | 326·7 | 31·1 | 10·0 | 490·9 | 14·2 | 2,076·6 |
| 1961/62 | 1,498·1 | 82·6 | 1,580·7 | 480·6 | 2,061·3 | 0·7 | 101·5 | 8·8 | 367·4 | 75·7 | 10·5 | 563·9 | 14·6 | 2,076·6 |
| 1962/63 | 1,534·0 | 62·4 | 1,596·4 | 402·3 | 1,998·7 | 0·3 | 74·0 | 8·4 | 378·6 | 1·0 | 3·0 | 465·0 | – 13·7 | 1,985·3 |
| 1963/64 | 1,753·6 | 80·5 | 1,834·1 | 402·5 | 2,236·6 | 0·2 | 66·8 | 8·4 | 383·5 | 20·0 | 4·5 | 483·2 | – 16·1 | 2,220·7 |
| 1964/65 | 1,731·9 | 71·5 | 1,803·4 | 471·2 | 2,274·6 | 0·1 | 122·5 | 8·3 | 385·1 | 21·9 | 5·0 | 542·8 | – 27·9 | 2,246·8 |
| 1965/66 | 1,792·0 | 68·5 | 1,860·5 | 528·4 | 2,388·9 | ... | 168·8 | 11·6 | 382·2 | 29·3 | 5·0 | 596·9 | 10·4 | 2,399·3 |
| 1966/67 | | | | | | | | | | | | | | |
| මුල් ඇස්තමේන්තු | 1,891·8 | 81·2 | 1,973·0 | 761·7 | 2,734·7 | ... | 251·8 | 15·9 | 553·4 | 16·8 | 5·0 | 842·9 | ලැ. නො. | 2,734·7 |
| නියම (තාවකාලික) | 1,818·5 | 76·8 | 1,895·3 | 624·7 | 2,520·0 | ... | 232·1 | 13·7 | 422·1 | 28·6 | 5·0 | 701·5 | 40·7 | 2,560·7 |
| මුල් ඇස්තමේන්තු | 1,999·5 | 79·7 | 2,079·2 | 782·5 | 2,861·7 | ... | 276·4 | 14·7 | 550·0 | 16·1 | 5·0 | 862·2 | ලැ. නො. | 2,861·7 |

(අ) ii වැනි පරිශිෂ්ටයේ 21 වෙනි සංඛ්‍යා සටහනෙහි 22 වැනි ශීර්ෂය බලන්න. ආවර්තන වියදමෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ කොටස් කිරීමක් එම සංඛ්‍යා සටහනේ දී ඇත.
(ආ) 1960/61 සිට ආවර්තන වැය සම්මතවල ප්‍රාග්ධන ශීර්ෂයන්හි අගයෙහි තියුණු පහළ බැසීමට හේතුව, මුලින් රජයේ ගිණුම්හි ආවර්තන වැය සම්මත යටතේ වර්ග කැරුණු ප්‍රාග්ධන ස්වරූපයෙන් යුත් ඇතැම් ශීර්ෂ, ප්‍රාග්ධන වැය සම්මතවලට මාරු කළ හෙයිනි.
(ඇ) ii (ඉ) i සංඛ්‍යා සටහනෙහි i (ආ) 1 ශීර්ෂය බලන්න.
(ඈ) ii (ඉ) i සංඛ්‍යා සටහනෙහි i (ආ) ii ශීර්ෂය බලන්න.
(ඉ) ii වැනි පරිශිෂ්ටයේ 21 වැනි සංඛ්‍යා සටහනෙහි 23 වෙනි ශීර්ෂය බලන්න.
(ඊ) ii (ඉ) සංඛ්‍යා සටහනෙහි i (ආ) (iv) සිට (vii) දක්වා ශීර්ෂවල එකතුව බලන්න.
(උ) ii (ඉ) i වෙනි සංඛ්‍යා සටහනෙහි i (ආ) ශීර්ෂය හා ii වැනි පරිශිෂ්ටයේ 21 වෙනි සංඛ්‍යා සටහනෙහි 27 වෙනි ශීර්ෂය බලන්න.

## සංඛ්‍යා සටහන II (ඉ) 4
## වර්තන වියදම 1964/65 සිට 1966/67

රුපියල් දශ ලක්ෂ

| | නියම 1964/65 | | නියම 1965/66 | | නියම (තාවකාලික) 1966/67 | | මුල් ඇස්තමේන්තු 1966/67 | | මුල් ඇස්තමේන්තු 1966/67 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපි. දශ ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රුපි. දශ ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රුපි. දශ ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශ ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශ ලක්ෂ | ප්‍රතිශතය |
| 1·පරිපාලනය .. | 243·6 | 14·1 | 257·7 | 14·4 | 273·3 | 15·0 | 276·5 | 14·6 | 303·7 | 15·2 |
| 2·සමාජ සේවා .. | 491·5 | 28·4 | 500·6 | 27·9 | 528·0 | 29·0 | 522·6 | 27·6 | 580·5 | 29·0 |
| මෙයින්— (අ) අධ්‍යාපනය | 329·0 | 19·0 | 331·6 | 18·5 | 347·7 | 19·1 | 347·4 | 18·4 | 382·0 | 19·1 |
| (ආ) සෞඛ්‍යය · | 153·5 | 9·9 | 159·6 | 8·9 | 170·2 | 9·4 | 163·8 | 8·7 | 186·0 | 9·3 |
| 3·ආර්ථික සේවා | 124·4 | 7·2 | 122·1 | 6·8 | 137·7 | 7·6 | 144·5 | 7·6 | 167·3 | 8·4 |
| 4·රජයේ ව්‍යවසායයන්* | 246·9 | 14·3 | 259·2 | 14·5 | 267·5 | 14·7 | 258·2 | 13·6 | 273·5 | 13·7 |
| 5·සංක්‍රාම ගෙවුම් | 625·5 | 36·1 | 652·4 | 36·4 | 612·0 | 33·7 | 690·0 | 36·5 | 674·5 | 33·7 |
| මෙයින්— (අ) ආහාර සිහිවාධාර · | 290·0† | 16·7 | 290·0† | 16·2 | 193·0† | 10·6 | 307·3 | 16·2 | 217·5 | 10·9 |
| (ආ) රාජ්‍ය ණය පොළී .. | 105·9 | 6·1 | 123·1 | 6·9 | 143·4 | 7·9 | 139·7 | 7·4 | 159·4 | 8·0 |
| (ඇ) විශ්‍රාම වැටුප් .. | 143·3 | 8·3 | 141·4 | 7·9 | 146·0 | 8·0 | 156·4 | 8·3 | 164·4 | 8·2 |
| 6·වර්තන වියදම | 1731·9 | 100·0 | 1792·0 | 100·0 | 1818·5 | 100·0 | 1899·8 | 100·0 | 1996·5 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* දුම්රිය, විදුලිබල, තැපැල් හා විදුලි සංදේශ, ගුවන්විදුලි ප්‍රචාරක දෙපාර්තමේන්තුවල සහ වරාය කොමිසමේ වර්තන ගෙවුම් වලින් සමන්විත වෙයි. 1967. 5. 1. දින ගුවන් විදුලි ප්‍රචාරක දෙපාර්තමේන්තුව සංස්ථාවක් බවට පත් කරන ලදී.

* මේ සංඛ්‍යා භාණ්ඩාගාරයේ ලෙජර්වල දක්වෙන පරිදි වෙයි.

1964/65 සිට 1966/67 දක්වා මුදල් වර්ෂ සඳහා රජයේ වර්තන වියදම සවිස්තරව දක්වන මෙම වාර්තාවේ ඇති සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයේ 21 වෙනි සංඛ්‍යා සටහන, පහත දක්වෙන II (ඉ) 4 සංඛ්‍යා සටහනේ සංක්ෂිප්ත කොට ඇත.

1965/66 සමග සසඳ බලන විට, 1966/67 දී වර්තන වියදම ඉහළ යාමට සමාජ සේවා වියදම් (රුපියල් දශ ලක්ෂ 27·4 කින්) ආර්ථික සේවාවන් (රුපියල් දශ ලක්ෂ 15·6 කින්) පරිපාලනය (රුපියල් දශ ලක්ෂ 15·6) සහ රජයේ ව්‍යවසායයන් සඳහා වියදම් (රුපියල් දශ ලක්ෂ 8·3 කින්) වැඩිවීම හේතු වී ඇති බව පෙනේ. සංක්‍රාම ගෙවුම් රුපියල් දශ ලක්ෂ 40·4 කින් පහළ බැසීම නිසා, ඉහත කී වැඩිවීම තරමක් දුරට මැකී ගොස් ඇත.

සමාජ සේවා වියදම වැඩිවීමට හේතු වූයේ සෞඛ්‍ය සහ අධ්‍යාපනික සේවාවන් සඳහා කළ වර්තන වියදම් ඉහළ යාමයි. ජන සංඛ්‍යාව සහ පාසැල් යන ළමයින්ගේ ගණන වැඩිවන තත්ත්වයක් යටතේ මෙය බලාපොරොත්තු විය යුත්තකි.

ආර්ථික සේවාවන් හි වියදම වැඩිවීමට හේතුව කෘෂිකර්මයට, වාරිමාර්ග වලට සහ ප්‍රවාහන කටයුතු වලට සහ වර්තන වියදම් ඉහළ යාම වන අතර, පරිපාලනය සඳහා යන වියදම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ සිවිල් පරිපාලනයට යන වියදම ඉහළ යාමය.

සංක්‍රාම ගෙවුම් වල පහළ යාමට සම්පූර්ණයෙන්ම පාහේ හේතු වූයේ, ශුද්ධ ආහාර පිහිටාධාරයේ තියුණු පහළ යාමය. 1965/66 සඳහා නියම ආහාර පිහිටාධාරය ද, 1966/67 ආහාර ගනුදෙනුවල ප්‍රතිඵලයන් මුල් ඇස්තමේන්තු සහ තාවකාලික සංඛ්‍යාවන් ද II (ඉ) 5 සංඛ්‍යා සටහනෙන් පෙන්වයි. 1967/68 මුදල් වර්ෂය සඳහා අය වැය ලේඛනයේ දක්වුණු මුල් ඇස්තමේන්තු ද, ශුද්ධ ආහාර පිහිටාධාරය අනුව සංශෝධිත ඇස්තමේන්තු ද සංසන්දය කිරීම සඳහා දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II (ඉ) 5

## ආහාර පිහිටාධාරය — 1965/66 සිට 1967/68

රුපියල් දශ ලක්ෂ

| | 1965/66 | 1966/67 මුල් (1) ඇස්තමේන්තු | 1966/67 තාවකාලික | 1967/68 මුල් ඇස්තමේන්තු | 1967/68 සංශෝධිත (2) ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|
| 1. ආනයනය කළ සහල් වෙනුවෙන් පාරිභෝගිකයාට ආධාර .. | 181·2 | 163·2 | 205·1 | 211·9 | 286·4 |
| 2. මෙරට නිපද වූ සහල් වෙනුවෙන් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ආධාර .. | 269·9 | 330·0 | 206·6 | 213·2 | 237·7 |
| 3. මෙරට නිෂ්පාදිත රතුළූනු සඳහා ආධාර .. | 5·3 | 4·5 | 5·3 | 6·0 | 6·0 |
| 4. බෙදහැරීමේ ගාස්තු හා අනෙකුත් වියදම් .. | 33·5 | 33·0 | 38·7 | 40·6 | 46·8 |
| 5. මුළු දළ පිහිටාධාරය (1 සිට 4) .. | 489·9 | 533·7 | 455·7 | 471·7 | 576·4 |
| 6. සීනි විකිණීමෙන් ලාභ .. | 202·4 | 199·9 | 216·6 | 201·8 | 230·4 |
| 7. පිටි විකිණීමෙන් ලාභ .. | 0·5 | 20·7 | 42·7 | 46·4 | 45·5 |
| 8. අනෙකුත් භාණ්ඩ විකිණීමෙන් ලාභ .. | 13·2 | 5·9 | 3·4 | 6·0 | – 3·9 (3) |
| 9. එකතුව (6 සිට 8) .. | 216·1 | 226·5 | 262·8 | 254·2 | 272·0 |
| 10. ශුද්ධ ආහාර පිහිටාධාරය (5 සිට 9) .. | 273·8 | 307·3 | 193·0 | 217·5 | 304·5 |

මූලය: ආහාර කොමසාරිස්වරයාගෙනි.

(1) 1966 දෙසැම්බර් මස සහල් බෙදහැරීම පිළිබඳව ගන්නා ලද තීරණයට පෙර ඇස්තමේන්තු කරන ලදී.
(2) 1967 නොවැම්බර් මස අවප්‍රමාණ කිරීමට පසු ඇස්තමේන්තු කරන ලදී.
(3) බලපොරොත්තු වූ අලාභ.

1966 දෙසැම්බර් 18 වෙනි දින, රජය සහල් මිල සහ සලාක ක්‍රමය වෙනස් කිරීමට තීරණය කළේය. සෑම කෙනෙකුගේම සලාක පොතට නිකුත් කරන පිහිටාධාර සහිත සහල් සේරු දෙක වෙනුවට එක සහල් සේරුවක් නොමිලයේ දීමට තීරණය කරන ලදී. මෙම ප්‍රතිපත්ති තීරණය හා ඒ අනුව සිදු වූ ධාන්‍ය පාරිභෝජන රටාවේ ඇති වූ වෙනස් වීමේත්, ප්‍රතිඵලය වූයේ 1965/66 වර්ෂය හා සසඳන විට 1966/67 ශුද්ධ ආහාර පිහිටාධාර වියදම රුපියල් දශ ලක්ෂ 80·8 කින් අඩුවීමයි. මේ අඩුවීම සාධක කිහිපයක ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

1965/66 හා සසඳන විට, පිටි හා සීනි විකිණීමෙන් ලැබෙන ලාභය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 42·2 කින් හා රුපියල් දශ ලක්ෂ 14·2 කින් වැඩිවිණි. පිටි විකිණීමෙන් විශාල ලෙස ලාභ ලබාගත හැකි වූයේ, විකුණුම් ප්‍රමාණය ටොන් 123,656 ක් හෙවත් සියයට 46 කින් වැඩිවීම හා පිටිවල විකුණුම් මිල රාත්තල ශත 5 කින්[1] වැඩිවීම නිසාය. අනික් අතට සීනි වලින් ලාභ ලබා ගත හැකි වූයේ, 1965/66 හා සසඳන විට 1966/67 ගොඩබාන විට පැවති මිල පහළ මට්ටමක විමයි. පාරිභෝගිකයාට විකුණන මිල ස්ථාවරව පැවති අතර, ගොඩබාන විට පවතින, ටොන් එකක සාමාන්‍ය මිල රුපියල් 38 කින් අඩු වී රුපියල් 440 දක්වා පහළ වැටුණි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස ආනයන කරන සහල් සඳහා පාරිභෝගිකයාට දෙන පිහිටාධාරය, 1965/66 හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 23·9 කින් වැඩිවිය. මෙය සිදුවූයේ විදේශ වලින් ගත් සහල් ප්‍රමාණය පහළ ගියත්, ගොඩබාන විට සහල් ටොන් එකක සාමාන්‍ය මිල රු. 586·47

1. 1966 ජූලි 29 වෙනි දින අය වැය කථාවෙන් ප්‍රකාශයට පත්කළ පරිදිය. 1966 ජූලි 29 වැනි දින නො: 14,706/1 ගැසට් පත්‍රය ද බලන්න.

රු. 648·58 තෙක් රුපියල් 62·11 කින් හෙවත්, සියයට 11 කින් තියුණු ලෙස ඉහළ ගිය නිසාය. කෙසේ වුව ද, 1966/67 දී මිලදී ගත් සහල් ප්‍රමාණය ටොන් 168,440 කින්, ටොන් 380,733 දක්වා, හෙවත් සියයට 11 කින් පහළ වැටුණි. II (ඉ) 5 සංඛ්‍යා සටහනෙන් පෙන්නුම් කරන පරිදි ස්වදේශීය සහල් නිෂ්පාදනයට හා පාරිභෝජනයට දෙන පිහිටාධාරය රුපියල් දශ ලක්ෂ 63·3 කින් පහළ වැටුණි. ගොවිජන සේවා කොමසාරිස් තැනගෙන් මිලදී ගෙන අනතුරුව පාරිභෝගිකයාට විකුණන සහල් ප්‍රමාණය 1965/66 දී පැවති ටොන් 388,660 සිට ටොන් 215,600 දක්වා 1966/67 දී අඩුවීම මෙයට තරමක් දුරට හේතු විය. බෙදා හැරීමේ වියදම් හා අනෙකුත් වියදම් රුපියල් දශ ලක්ෂ 5·2 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විමර්ශනයට භාජනය වන වර්ෂයේ දළ පිහිටාධාරය 1965/66 වර්ෂයේ ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 489·9 සිට රුපියල් දශ ලක්ෂ 34·2 කින්, රුපියල් දශ ලක්ෂ 455·7 දක්වා පහළ වැටුණි.

1965/66 හා සසඳන කල, සීනි, පිටි හා අනෙකුත් ද්‍රව්‍ය වෙළඳමෙන් ලැබෙන ලාභ හා ඇණුම් වලට නිෂ්පාදකයාට දෙන පිහිටාධාරය ද ගණන් ගෙන බලන විටදී, ශුද්ධ පිහිටාධාරය රුපියල් දශ ලක්ෂ 80·8 කින් පහළ වැටුණි.

1966/67 මුදල් වර්ෂයේදී ආනයනය කළ ධාන්‍ය (සහල් හා පිටි) ප්‍රමාණය හා ඒවායේ වියදම වැදගත් කමෙන් යුක්තය. විශේෂයෙන් 1966 දෙසැම්බරයේ සහල් බෙදා හැරීම පිළිබඳව ගන්නා ලද තීරණය අනුව සලකා බලන විට, මෙය පෙනේ. 1965/66 දී ආනයනය කළ ධාන්‍යවල නියම විකිණීම් ප්‍රමාණය ටොන් දශලක්ෂ 0.830 ක් නමුත්, 1966/67 දී ආනයනය කොට විකිණීම කළ ධාන්‍ය ප්‍රමාණය ටොන් දශ ලක්ෂ 0.767 ක් වීය. [1]විමර්ශනය වන මුදල් වර්ෂයේදී ආනයනය කොට විකුණූ ධාන්‍ය ප්‍රමාණයෙහි ටොන් දශ ලක්ෂ 0·061 ක (හෙවත් සියයට 7·3 ක) පහළ බැසීමක් තිබුණි.

**ප්‍රාග්ධන වියදම.**

II (ඉ) 3 සංඛ්‍යා සටහනේ දක්වා ඇති පරිදි, 1966/67 නියම (තාවකාලික) ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 701·5 ක් වීය. මෙම සංඛ්‍යා සැකසෙන්නේ, රජයේ ගිණුම් වල, 3, 5, සහ 7 යන වැය සම්මත යටතේ දරන වියදම් ද, 1, 2, 4 සහ 6 යන වැය සම්මත වලට ඇතුළත් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකිය හැකි වියදම් ද, ජාතික සංවර්ධන සංචිතයට අයත් කළ හැකි වියදම් ද, එකතු වීමෙනි. මෙසේ නිර්වචනය කර ඇති මුළු ප්‍රාග්ධන වියදම, 1965/66 අනුරූප සංඛ්‍යා සමග සසඳන විට, රුපියල් දශලක්ෂ 104·6 කින් හෙවත්, සියයට 18 කින් වැඩි වී ඇත. 1955/56 සිට 1965/66 දක්වා දශ වර්ෂ කාලච්ඡේදය තුළදී ප්‍රාග්ධන වියදම් වල වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 5 කි (සංයුක්ත). එහෙයින් 1966/67 ප්‍රාග්ධන වියදම්හි වැඩිවීම, පසුගිය දශ වර්ෂයේ මුදුන් පමුණුවාගත් වෘද්ධි අනුපාතයට වඩා ඉහල මට්ටමක වන බව පෙනේ.

තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී ප්‍රාග්ධන වියදම් වල වර්ධනයෙහි පැහැදිලි ලක්ෂණයක් වශයෙන් රජයේ සංස්ථාවලට දෙන ලද ප්‍රාග්ධන දීමනාවල වැඩිවීමක් පෙනෙන්නට ඇත. 1964/65 දී සංස්ථාවලට දෙන ලද දීමනා රුපියල් දශලක්ෂ 122·5 ක් (හෙවත් මුළු ප්‍රාග්ධන වියදමින් සියයට 23 ක්) වූ අතර, 1965/66 දී එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 168·8 දක්වා ද (හෙවත් සියයට 28 ක්) 1966/67 දී රුපියල් දශලක්ෂ 232·1 දක්වාද (සියයට 33 ක්) වැඩිවිණි. අනෙක් අතින්, 1964/65 රුපියල් දශලක්ෂ 285·1 ක් වූ මධ්‍යම ආණ්ඩුවේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, 1965/66 දී තරමක් පහළ වැටුන නමුත්, 1966/67 දී රුපියල් දශලක්ෂ 39·9 කින් වැඩිවී, මුළු ගනන රුපි. දශලක්ෂ 422·1 කට වැඩි වූ අතර, එම මට්ටම සෑම මුදල් වර්ෂයකටම වඩා වැඩිය.

1. ආහාර කොමසාරිස් වරයාගෙන් ලබාගත් සංඛ්‍යා තොරතුරු අනුව.

II. පරිශිෂ්ටයේ 26 වෙනි සංඛ්‍යා සටහන, ප්‍රාග්ධන වියදමෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ වර්ග කිරීමක් ඉදිරිපත් කරයි. ආර්ථික සේවාවන් (රුපියල් දශලක්ෂ 92·9 ක්) සඳහා කරන ප්‍රාග්ධන වියදමේ සැලකිය යුතු වැඩිවීමක් ඇති බව පෙනේ. ආර්ථික සේවාවන් අතුරෙන් නිෂ්පාදනය හා පතල් කර්මාන්තය සඳහා වියදම රුපියල් දශලක්ෂ 53·4 කින් ද, ප්‍රවාහන කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 23·7 කින් සහ කෘෂිකර්ම හා වාරිමාර්ග සඳහා රුපි. දශලක්ෂ 15·9 කින් ද වැඩි වී ඇත.

සමාජ සේවා ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 16 ක වැඩිවීමක් පෙන්නුම් කළේ සෞඛ්‍ය, නිවාස හා අධ්‍යාපන වියදම් වැඩිවීමෙනි.

**අත්තිකාරම් ගිණුම් කටයුතු**

1966/67 දී අත්තිකාරම් ගිණුම් කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් දශලක්ෂ 40·7 ක ශුද්ධ ගෙවීමක් විය. මෙය 1965/66 ශුද්ධ ගෙවීම වන රුපියල් දශලක්ෂ 10·4 හා සැසඳේ. දැනට ලැබී ඇති තොරතුරු අනුව, මෙම ගෙවීම් සවිස්තරව සැපයිය නොහැකිය. කෙසේ වෙතත්, ශුද්ධ ගෙවීමට ප්‍රධාන හේතුව රජයේ දෙපාර්තමේන්තු වලට දුන් අත්තිකාරම් වැඩිවීම වන අතර, චීනය සමග ඇති රබර්/සහල් ගිවිසුම යටතේ ලංකාවෙන් චීනයට ලැබියයුතු ශේෂය වැඩිවීම නිසා, ශුද්ධ ගෙවීම තරමක් දුරට මැකී ගොස් ඇත.

**ශුද්ධ අය වැය හිඟය**

1966/67 මුදල් වර්ෂය වෙනුවෙන් ඇති රුපියල් දශලක්ෂ 606·0 ක් වූ ශුද්ධ මුදල් හිඟය, මෙතෙක් වාර්තාගත වී ඇති වැඩිම හිඟයයි. මෙය 1965/66 ශුද්ධ අය වැය හිඟයට (රුපි. දශලක්ෂ 566·0) වඩා රුපි. දශ ලක්ෂ 40·0 කින් (හෙවත් සියයට 7 කින්) වැඩිය. 1966/67 මෙම ශුද්ධ මුදල් හිඟයට හේතු වූයේ ප්‍රාග්ධන වැය සම්මිත වලට අයත් වියදම්, රුපියල් දශලක්ෂ 96·3 කින් හා ආවර්තන වියදම් රුපියල් දශලක්ෂ 34·8 කින් ද, අත්තිකාරම් ගිණුම් ගණුදෙනු වල ගෙවීම් තවත් රුපියල් දශලක්ෂ 30. 3 කින් ද වැඩිවීමයි. ලැබුණු අයභාරය ද රුපියල් දශලක්ෂ 121·4 කින් වැඩිවීම නිසා මෙම ශුද්ධ අය වැය හිඟය තරමක් අඩු විය. 1966/67 දී රුපියල් දශලක්ෂ 40·0 කින් ශුද්ධ මුදල් හිඟය වැඩි වුවද, රුපියල් දශලක්ෂ 135·6 ක තරම් ප්‍රමාණයක හෙවත් සියයට 32 ක, වැඩිවීමක් දක් වූ 1965/66 වර්ෂය සසඳන කල මෙම වැඩිවීම ඉතා කුඩාය.

1966/67 නියම (තාවකාලික) ශුද්ධ මුදල් හිඟය ද එම වර්ෂයේ මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 29·8 කින් වැඩිය. වර්ෂයේ මුල් ඇස්තමේන්තු හා සසඳන කල 1966/67 නියම ශුද්ධ අය වැය හිඟයේ වැඩිවීමට හේතු වූයේ ආදායම් වල (රුපියල් දශලක්ෂ 78.3) අඩුවීමය. එය තරමක් අඩු වූයේ වියදම් ප්‍රමාණය [1]රුපියල් දශලක්ෂ 48·5 කින් පහළ වැටීම නිසාය අත්තිකාරම් ගිණුම් ගණුදෙනුවල රුපියල් දශලක්ෂ 40·7 ක ශුද්ධ ගෙවුමක් තිබියදීත්, වියදම් ප්‍රමාණය පහළ වැටුනේ, (වර්තන[2] හා ප්‍රාග්ධන වියදම්[3]) පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 28·4 කින් හා රුපියල් දශලක්ෂ 60·8 කින් පහළ වැටීම නිසාය.

**හිඟය පියවීම**

ශුද්ධ අය වැය හිඟය පියැවුණු ආකාරය හා එහි ප්‍රසාරණාත්මක බලපෑම ඉකුත් මුදල් වර්ෂයේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 6 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ.

---

1. අත්තිකාරම් ගිනුම් ගනුදෙනු සඳහා වියදම් වූ ශුද්ධ වියදම ඇතුළුව.
2. ආවර්තන වියදම් සම්මිත වල මුල් ඇස්තමේන්තු වලින් සියයට 2½ ක අඩුවීමකට ඉඩ තැබීමෙන් පසුය.
3. ප්‍රාග්ධන වියදම් සම්මතවල මුල් ඇස්තමේන්තු වලින් සියයට 10 ක අඩුවීමකට ඉඩ තැබීමෙන් පසුය.

## සංඛ්‍යා සටහන II (ඉ) 6
## හිඟය පියවූ ආකාරය

රුපියල් දශ ලක්ෂ

| | 1965/66 | | | 1966/67 (තාවකාලික) | | |
|---|---|---|---|---|---|---|
| 1. විදේශීය මුදල් | | | | | | |
| (අ) යෝජනා ක්‍රම ණය (දළ) .. | 77·2 | | | 42·4 | | |
| අඩු කිරීම: නැවත ගෙවීම් හා නිදන් අරමුදල් දායක දීමනා .. | 35·9 | 41·3 | | 44·9 | −2·5 | |
| (ආ) භාණ්ඩ ආධාර (දළ) .. | 35·2 | | | 193·9 | | |
| අඩු කිරීම: නැවත ගෙවීම් .. | — | 35·2 | | 2·1 | 191·8 | |
| (ඇ) දීමනා .. | | 41·5 | 118·0 | | 19·3 | 208·6 |
| 2. දේශීය වෙළෙඳ පොළෙන් නොවන ණය ගැනීම්· | | | 112·2 | | | 72·2 |
| 3. දේශීය වෙළෙඳ පොළේ බැංකු ක්‍රමයෙන් ගත් ණය‡ | | | | | | |
| (අ) මහ බැංකුව .. | | 179·7 | | | 125·7 | |
| (ආ) වෙළෙඳ බැංකු .. | | −17·4 | 162·3 | | −74·5 | 51·3 |
| 4. බැංකු නොවන දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය | | | | | | |
| ණයට ගත් ප්‍රමාණය (දළ) .. | | 314·8 | | | 364·5† | |
| අඩු කිරීම: නිදන් අරමුදල් දායක දීමනා .. | | 58·9 | 255·9 | | 67·5 | 297·0 |
| 5. මුදල් ශේෂ හා ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය මුදල් අඩුවීම | | | | | | |
| (අ) මුදල් ශේෂ .. | | −47·2* | | | 20·6 | |
| (ආ) ද්‍රව්‍යාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් (දළ බැර) .. | −35·2* | | | −193·9* | | |
| අඩු කිරීම: අයවැය කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය .. | — | −35·2* | −82·4* | 150·0 | −43·9* | −23·3* |
| 6. ශුද්ධ අය වැය හිඟය .. | | | 566·0 | | | 606·0 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් අඩුවීම .. | | | 42·5 | | | 27·2 |
| 8. රජයේ මුදල් ගනුදෙනු වල ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම (3+5+7) .. | | | 122·4 | | | 52·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* ඍණ ලකුණ වැඩිවීමක් දක්වයි.

‡ බැංකු ක්‍රමය මගින් දරනු ලැබූ රජයේ ආනයන (ආහාර) බිල්වල වටිනාකම මෙම සංඛ්‍යා වලට ඇතුළත් නොවේ.

(අ) 1965/66 මුදල් වර්ෂයේ දී මිලට ගෙන තිබුණ බිල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 22·7 කින් වැඩි වී, 1966 සැප්තැම්බර් අග දී රුපියල් දශ ලක්ෂ 76·0 ක් විය.

(ආ) 1966/67 මුදල් වර්ෂයේ දී, මිලට ගෙන තිබුණ බිල් පත්‍රවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 46·3 කින් වැඩි වී, 1966 සැප්තැම්බර් අග දී රුපියල් දශ ලක්ෂ 122·3 ක් විය.

† ඉතිරි කිරීමේ ආයතන සහ රාජ්‍ය නියෝජිත ආයතන දරන මහ බැංකු සුරැකුම් පත් මහ බැංකුව විසින් නැවත මිලට ගැනීමේ ප්‍රතිඵලය වශයෙන්, මෙම ආයතන විසින් මිලට ගත් රජයේ සුරැකුම් පත් රුපියල් දශ ලක්ෂ 53·4 ක වටිනාකම ද ඇතුළත්වය.

1966/67 වර්ෂයේ මුදල් ගනුදෙනුවල ප්‍රතිඵලය වූ රුපියල් දශලක්ෂ 606·0 ක ශුද්ධ මුදල් හිඟය, බැංකු නොවන දේශීය මාර්ග වලින්, රුපියල් දශලක්ෂ 297·0 ක් ණයගැනීමෙන් ද විදේශ ආධාර වලින් රුපියල් දශලක්ෂ 208·6 ක් ද, වෙළෙඳ නොවන දේශීය මාර්ග වලින් රුපියල් දශලක්ෂ 72·2 ක් ද, රුපියල් දශලක්ෂ 51·3 ක් බැංකු ක්‍රමයෙන් ලබා ගැනීමෙන් ද පියවන ලදී. මුදල් ශේෂ (ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ඇතුළුව) රුපියල් දශලක්ෂ 23·3 වැඩි විණි.

මෙම හේතු නිසා 1966/67 ශුද්ධ අය වැය හිඟය රුපියල් දශලක්ෂ 40·00 කින් ඉහළ ගියේය. කෙසේ වුවද ශුද්ධ මුදල් හිඟයෙහි වූ ප්‍රාසාරණාත්මක කොටස 1965/66 හා සසඳන කල, නිරපේක්ෂ වශයෙන් මෙන්ම විමර්ශනයට භාජනයවන වර්ෂයේ හිඟයෙහි අනුපාතයක් වශයෙන් ද, පහළ ගියේය. 1966/67 හිඟයෙහි ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 55·2 ක් වූ අතර, එය 1965/66 අනුරූප සංඛ්‍යාවට වඩා රුපියල් දශලක්ෂ 67·2 කින් අඩුය. තවද ශුද්ධ මුදල් හිඟයේ ප්‍රාසාරණාත්මක කොටස අයවැය හිඟයේ අනුපාතයක් වශයෙන් බලන කල ද 1965/66 පැවති සියයට 21·6 සිට සියයට 9·1 දක්වා 1966/67 දී පහළ වැටුණි. මීට බොහෝසෙයින් හේතු වූයේ, බැංකු ක්‍රමයෙන් ගන්නා ණය ගැනීම් අඩු කර හිඟය පියවා ගැනීම සඳහා විදේශීය මුදල් හා දේශීය බැංකු නොවන මාර්ග කෙරේ වැඩියෙන් රැඳී සිටීම නිසාය.

II (ඉ) 6 සංඛ්‍යා සටහනෙන් දක්වෙන පරිදි, අය වැය කටයුතු සඳහා බැංකු ක්‍රමයෙන් ලබාගත් රුපියල් දශලක්ෂ 51·3 ක ශුද්ධ ණය ගැනීම මුළුමනින්ම සිදුවූයේ මහබැංකුව කෙරෙහි රැඳී සිටීම වැඩිකර ගැනීම නිසාය. මහ බැංකුවෙන් ණය ලබාගත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 125·7 කින් වැඩි විය. භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශලක්ෂ 119·3 කින් වැඩිවීම හා මෙයට ඇතුලත් වූ අතර, එය මදක් අඩු කළේ මහ බැංකුව දරණ රජයේ සුරැකුම්පත් ප්‍රමාණයේ සුළු පහළ වැටීම (රුපියල් දශලක්ෂ 0·6) නිසාය. අනෙක් අතට, වෙළෙඳ බැංකු වලින් ලබාගත් ණය ප්‍රමාණයේ ශුද්ධ පහළ බැසීමක් විය[1]. මෙම අඩුවීම (රුපියල් දශලක්ෂ 74·5), රජයේ සුරැකුම්පත් (රුපියල් දශලක්ෂ 42·7) සහ භාණ්ඩාගාර බිල්පත් (රුපියල් දශලක්ෂ 31·9) දැරීම පහළ වැටීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. මේ තත්ත්වය තරමක් දුරට අඩු වූයේ වෙළෙඳ බැංකු බදු සංචිත සහතික දැරීම (රුපියල් දශලක්ෂ 0·1) වැඩි කිරීම නිසාය.

### සංඛ්‍යා සටහන II (ඉ) 7

### බැංකු නොවන ප්‍රධාන ආයෝජන කොටස් විසින් රජයේ සුරැකුම්පත් වෙනුවෙන් කැරුනු දයක දීමනා

| | 1963/64 | 1964/65 | 1965/66 | 1966/67 | 1965/66 ට වඩා 1966/67 තේ වැඩිවීම |
|---|---|---|---|---|---|
| 1. ඉතිරි කිරීමේ ආයතන .. | 28·9 | 57·9 | 37·0 | 88·6[1] | 51·6 |
| 2. සේවක අර්ථසාධක අරමුදල .. | 65·6 | 70·0 | 74·7 | 83·2 | 8·5 |
| 3. රක්ෂණ සංස්ථාව .. | 29·0 | 42·2 | 46·2 | 49·9 | 3·7 |
| 3. අනෙකුත් රජයේ සමායතන .. | 3·5 | — | — | — 0·7 | — 0·7 |
| 5. දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලීය අරමුදල් | 9·6 | 13·8 | 2·0 | 16·3 | 14·3 |
| 6. අනෙකු අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් .. | 22·0 | 28·4 | 41·1 | 41·3 | 0·2 |
| 7. අනෙකුත් රක්ෂණ අරමුදල් .. | 7·6 | 3·4 | 10·3 | 0·1 | —10·2 |
| 8 සමාගම්, සමාජ හා ආයතන .. | 12·3 | — 2·1 | 6·1 | —12,3 | —18·4 |
| 8. පුද්ගලයින් .. | 1·2 | 2·7 | 15·2 | 6·5 | — 8·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1. ඉතිරිකිරිමේ ආයතනයන් දරණ ලද මහ බැංකු සුරැකුම්පත් මහ බැංකුව ආපසු මිලදී ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආයතනයන් විසින් මිලදී ගනු ලැබූ රුපියල් දශ ලක්ෂ 53·4 ක රජයේ සුරැකුම්පත් ඇතුළත්ය.

1966/1967 දී බැංකු නොවන ශුද්ධ වෙළෙඳ පොළ මාර්ග වලින් ගත් ණය ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 297·0, 1965/66 එකී මාර්ග වලින් ගත් ප්‍රමාණයට (රුපියල් දශ ලක්ෂ 255·9) වඩා වැඩි විය. 1966/67 ලබාගත් සම්පත් ප්‍රමාණයට රුපියල් දශ ලක්ෂ 53·4 ක් වූ ඉතිරි කිරීමේ ආයතන විසින් මිලදී ගත් රජයේ සුරැකුම්පත් ඇතුලත් වේ. මෙය මහ බැංකුව විසින් තමන්ගේම සුරැකුම් පත් නැවත මිලදී ගැනීම නිසාම, මෙම සංඛ්‍යාව ඉවත් කළ විට විමර්ශනයට භාජනය වන මුදල් වර්ෂය තුළදී ඇත්ත වශයෙන්ම, බැංකු නොවන වෙළෙඳ පොල මාර්ග වලින් ගත් ණය, ප්‍රමාණය පහළ වැටී ඇති බව පෙනේ. 1961/62 සිට 1965/66 තෙක් වූ කාලය තුල මෙම අංශයෙන් ලැබුණ ණයෙහි වාර්ෂික සාමාන්‍යය රුපියල් දශ ලක්ෂ 36·6 කින් වැඩිවීම හා සසඳන කල මෙම පහළ බැසීමේ වැදගත් කම් වඩාත් හොඳට පෙනේ. විශේෂයෙන්ම ප්‍රාසාරණාත්මක මාර්ග වලින් රජය කරන ණය ගැනීම් ප්‍රමාණය යෝග්‍ය මට්ටමක පවත්වා ගැනීමට නම්, ඉදිරි වර්ෂ වලදී මෙම මාර්ගයෙන් මුදල් ගැනීම වැඩි කිරීම අවශ්‍ය වෙයි. ඉතිරි කිරීම්, සඳහා වැඩි පොළියක් ගෙවීමට, ඉතිරි කිරීමේ ආයතනවලට හැකි වන පරිදි, රජයේ ණය ගැනීම් වෙනු වෙන් වැඩි පොළියක් ගෙවිය යුතු යැයි මේ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය, නිර්දේශ කොට ඇත.

ඉතිරි කිරීමේ ආයතන වන සේවක අර්ථ සාධක අරමුදල සහ දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය අරමුදල්, 1966/67 දී රජයේ සුරැකුම්පත්වල යොදා ඇති තමන්ගේ දායක කොටස් සැලකිය යුතු තරමකින් වැඩි කරන ලදී. 1966/67 දී ප්‍රධාන ආයෝජන සමූහ විසින් රජයේ සුරැකුම්පත් වල, (භාණ්ඩාගාර බිල්පත් සහ බදු සංචිත සහතික ඇතුළුව) කෙරුන දායක දීමනා, පසුගිය මුදල් වර්ෂ තුනේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (ඉ) 7 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

1. II (ඉ) 6 වැනි සංඛ්‍යා සටහනේ 1 වැනි පාද සටහනෙහි සඳහන් කොට ඇති පරිදි, ආනයන බිල්පත් දැරීම මාර්ගයෙන්, වාණිජ බැංකු විසින් රජය වෙත දෙන ලද ණය මෙයට ඇතුළත් නොවේ.

1966/67 දී ලැබුණු විදේශ මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 255·6 ක් වූ අතර මෙය, ඉකුත් මුදල් වර්ෂයෙහි ලද රුපියල් දශලක්ෂ 153·9 හා 1964/65 දී ලද රුපියල් දශලක්ෂ 116·9 හා සැසඳේ.[1] ස්ටර්ලින් පවුම් ණය නිදන් අරමුදලේ දායක මුදල් සහ වෙනත් විදේශීය ණය නැවත ගෙවීම් රුපියල් දශ ලක්ෂ 47·0 ක් වූ බැවින්, 1966/67 වර්ෂයේ ලද ශුද්ධ විදේශීය ආධාර එකතුව රුපියල් දශ ලක්ෂ 208·6 ක් විය. 1965/66 සහ 1964/65 වර්ෂයන්හි, අනුරූප සංඛ්‍යාවන් පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 118·0 ක් සහ 99·7 ක් විය.

II (ඉ) 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි, 1966/67 වර්ෂයෙහි දී සැහෙන තරමින් විදේශීය ආධාර වැඩි වීමට හේතු වී ඇත්තේ, ණය මුදල් ලැබීම්ය. මෙය ද භාණ්ඩ ණය වශයෙනි. විදේශීය ණය ආධාර සම්බන්ධයෙන් සවිස්තර විශ්ලේෂණයක් මෙම වාර්තාවේ විදේශීය ණය ගැන ලියා වී ඇති කොටසේ දක්වා ඇත. 1966/67 මුදල් වර්ෂයන්හි දී යෝජනා ක්‍රම ණය ආධාර (දළ සහ ශුද්ධ) සහ පොදු අංශයේ ප්‍රාග්ධන සම්පාදනය සඳහා දුන් දීමනාවන්හි වැදගත්කම හීනවීම දක්වීම, දැනට ප්‍රමාණවත් වේ.

ඒවා II (ඉ) 8 වැනි සංඛ්‍යා සටහනෙහි, විදේශීය ආධාර ලැබීම්, ඒවායේ වර්ගය සහ ලැබුණු රටවල් යටතේ විස්තරාත්මකව සඳහන් කොට ඇත. 1965/66 වර්ෂයේ රුපියල් දශලක්ෂ 41·5 ක් වූ විදේශීය දීමනා, 1966/67 දී රුපියල් දශලක්ෂ 19·8 දක්වා පහළ වැටිණි. දීමනා ආධාර වශයෙන් ලැබී ඇති විශාලම මුදල (රුපියල් දශලක්ෂ 12·8) ඉකුත් මුදල් වර්ෂයෙහි දී මෙන්, කැනේඩියානු ආණ්ඩුව විසින් සපයා ඇත. ඕස්ට්‍රේලියානු ආණ්ඩුව සහ එක්සත් ජාතීන්ගේ ආයතනයන් ද, පිළිවෙලින් රුපියල් දශලක්ෂ 4·6 ක සහ රුපියල් දශලක්ෂ 1·5 ක දීමනා ආධාර සපයා ඇත.

සංඛ්‍යා සටහන II (ඉ) 8

විදේශීය ආධාර වල ශුද්ධ ලැබීම්

රුපියල් දශ ලක්ෂ

| | 1961/62 | 1962/63 | 1963/64 | 1964/65 | 1965/66 | 1966/67 |
|---|---|---|---|---|---|---|
| **ණය** | | | | | | |
| 1. ජා. ප්‍ර. ස.බැංකුව | 25·6 | 21·2 | 11·3 | 5·0 | – 1·2 | – 0·3 |
| 2. කැනඩාව | – 1·3 | 0·8 | – 0·2 | 11·4 | 2·5 | 8·1 |
| 3. චීනය | – 1·0 | – | 12·4 | 18·0 | 9·7 | – 4·9 |
| 4. එ. රාජධානිය | 0·4 | 10·4 | 4·9 | – 2·3 | 10·6 | 49·4 |
| 5. ඇමෙරිකා එක්සත් ජනපදය | 7·6 | – 0·7 | 2·7 | – 1·2 | 23·8 | 31·0 |
| 6. සෝ. ස. ස. සංගමය | 3·4 | 13·5 | 32·0 | 28·8 | 9·3 | – 10·0 |
| 7. බටහිර ජර්මනිය | – | 11·5 | 0·4 | 7·4 | 6·7 | 66·2 |
| 8. යුගෝස්ලේවියාව | – | 4·3 | .. | – 0·3 | 0·8 | – 1·4 |
| 9. පෝලන්තය | – | – | – | 2·4 | 0·1 | 0·1 |
| 11. ප්‍රංශය | – | – | – | 5·5 | 1·6 | 10·8 |
| 12. ජපානය | – | – | – | – | 10·0 | 31·3 |
| 13. ඉන්දියාව | – | – | – | – | 2·6 | 8·0 |
| 10. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | – | – | – | – | – | 1·1 |
| **දීමනා** | | | | | | |
| කොළඹ ක්‍රමය | | | | | | |
| 1. ඕස්ට්‍රේලියාව | – | 2·5 | – | 3·9 | 0·3 | 4·6 |
| 2. කැනඩාව | 4·4 | 5·7 | 5·7 | 5·1 | 25·6 | 12·8 |
| 3. ජපානය | – | – | 0·3 | – | – | – |
| **අනෙකුත්** | | | | | | |
| 1. චීනය | 8·3 | 19·7 | 24·5 | 15·1 | 2·5 | – |
| 2. ඇමෙරිකා එක්සත් ජනපදය | 1·6 | 0·9 | 1·4 | .. | 12·1 | 0·2 |
| 3. බටහිර ජර්මනිය | 3·8 | 2·3 | – | – | – | – |
| 4. එක්සත් ජාතීන් | – | – | – | – | 1·0 | 1·5 |
| 5. චෙකොස්ලොවැකියාව | – | – | – | – | – | .. |
| 6. එක්සත් රාජධානිය | – | – | – | – | – | .. |
| **ණය හා දීමනා එකතුව** | 52·9 | 92·0 | 95·4 | 99·7 | 118·0 | 208·6 |

මූලය ශ්‍රී ලංකා මහ බැංකුව

.1 කාර්මික ආධාර, නෙ.මිලේ ලැබෙන කිරි පිටි ද්‍රව්‍ය සහ "කෙයාර්" සංවිධානයෙන් ලැබෙන පිටි යනාදිය ඇතුළත් නොවේ.

## සංඛ්‍යා සටහන II (ඉ) 9

### මුළු රාජ්‍ය ණය[1]

| සැප්තැම්බර් අවසානයේ දී | දළ ණය | | | | | ශුද්ධ ණය 2 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
| අ. වටිනාකම් (රුපි. දශ ලක්ෂ) | | | | | | | | | | |
| විදේශීය .. | 407·1 | 412·1 | 489·3 | 548·8 | 739·3 | 311·5 | 373·5 | 446·6 | 521·1 | 708·0 |
| දේශීය .. | 3030·2 | 3375·3 | 3695·5 | 4194·5 | 4582·2 | 2753·9 | 3062·5 | 3325·3 | 3746·5 | 4074·3 |
| එකතුව .. | 3437·3 | 3787·4 | 4184·8 | 4743·4 | 5321·5 | 3065·4 | 3436·0 | 3771·9 | 4267·6 | 4782·3 |
| ආ. සියයට ගණන් | | | | | | | | | | |
| විදේශීය .. | 11·8 | 10·9 | 11·7 | 11·6 | 13·9 | 10·2 | 10·9 | 11·8 | 12·2 | 14·8 |
| දේශීය .. | 88·2 | 89·1 | 88·3 | 88·4 | 86·1 | 89·8 | 89·1 | 88·2 | 87·8 | 85·2 |
| එකතුව .. | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1. 1967 සැප්තැම්බර් මාසය අවසානයේ දී පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 75·0 ක් සහ රුපියල් දශ ලක්ෂ 33·3 ක් වූ ජාතික නිවාස ණයකර සහ රජයේ උකස් බැංකු ණයකර ඇතුළත් නොවේ.
2. එනම්, නිදන් අරමුදල් වල වටිනාකම අඩුකොට.

### රාජ්‍ය ණය:

රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු දෙවැනි පරිශිෂ්ටයේ 23 වැනි සහ 24 වැනි සංඛ්‍යා සටහන් වල දක්වා ඇත. පසුගිය මුදල් වර්ෂ පහේ එක් එක් වර්ෂයේ අවසානයේ තිබූ මුළු රාජ්‍ය ණයෙහි (දළ සහ ශුද්ධ) දේශීය හා විදේශීය කොටස් වල වැදගත්කම පහත දක්වෙන 11 (ඉ) 9 දරණ සංඛ්‍යා සටහනෙන් විශ්ලේෂණය කොට ඇත.

1966/67 මුදල් වර්ෂයෙහි දළ ණයෙහි සහ ශුද්ධ ණයෙහි වැඩිවීම පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 578.·2 සහ 514·7 විය. ඉකුත් මුදල් වර්ෂයට අදාල අනුරූප සංඛ්‍යා, පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 558.5 සහ 495.7 ක් විය. දළ ණයෙහි රුපියල් දශ ලක්ෂ 578.2 ක වැඩිවීම, රුපියල් සුරැකුම්පත් වල රුපියල් දශ ලක්ෂ 310.2 ක් ද, විදේශීය ණයෙහි රුපියල් දශ ලක්ෂ 190.5 ද, භාණ්ඩාගාර බිල්පත් වල රුපියල් දශ ලක්ෂ 75.0 සහ මහ බැංකු අත්තිකාරම් වල රුපියල් දශ ලක්ෂ 9·0 ද යන වැඩිවීම් වලින් ද, රුපියල් දශ ලක්ෂ 6.5 කින් බදු සංචිත සහතික අඩු වීමෙන් සිදු වූ හිලව් වීමෙන් ද සමන්විත විය. 1966/67 මුදල් වර්ෂය තුළ මුළු (දළ සහ ශුද්ධ) රාජ්‍ය ණයෙහි වැඩිවීම ඉකුත් වර්ෂ සතරටම වඩා වැඩි විය.

විමර්ශනයට භාජන වී ඇති මුදල් වර්ෂයෙහි, මුළු ශුද්ධ ණයෙහි විදේශීය ණය කොටස සියයට 2·6 කින් වැඩිවීම ද වැදගත්ය. දැනට, විදේශීය ණයෙහි සීඝ්‍රව ඉහළ යාමේ උපනතියක් දිස් වේ. ඉකුත් මුදල් වර්ෂ සතර තුළදී, විදේශීය ණය නිරපේක්ෂක වශයෙන්, දෙගුණයකට වඩා වැඩි විය. එම කාලච්ඡේදය තුළදී, දේශීය ණය වැඩි වූයේ අඩකින් පමණි.

### දේශීය ණය:

1966 සැප්තැම්බර් 30 දින, රුපියල් දශ ලක්ෂ 4,194·5 ක් වූ දේශීය ණය ප්‍රමාණය, 1966/67 මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 387·7 කින් වැඩි විය. එදින වන විට, ණය සකස් වී තිබුණේ පහත දක්වෙන අයුරිනි: රුපියල් සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 2784·8, භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 1,500·0 සහ බදු සංචිත රුපියල් දශ ලක්ෂ 25.7 ක් ද විය; මහ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 271.6 සහ ජාතික සංවර්ධන පිළිනපත් රුපියල් දශ ලක්ෂ 0·1 ද විය.

1966 සහ 1967 වර්ෂ අගදී රාජ්‍ය ණයෙහි සැකැස්ම සහ ඇතිවූ වෙනස්කම් II (ඉ) 10 වැනි සංඛ්‍යා සටහනෙහි සඳහන් වෙයි.

සංඛ්‍යා සටහන II (ඉ) 10

දේශීය රාජ්‍ය ණය සැකැසුම

| සැප්තැම්බර් අවසානයේදී | රුපියල් ණය | | | භාණ්ඩ ගාර බිල්පත් | බද්ධ සංචිත සහතික පත් | මහ බැංකු අත්තිකාරම් | ජාතික සංවර්ධන පිළිනපත් | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ | නිදන් අරමුදල් (1) | ශුද්ධ | | | (2) | (3) | දළ | ශුද්ධ |
| 1966 .. | 2,474·6 | 448·0 | 2,026·6 | 1,425·0 | 32·2 | 262·6 | 0·1 | 4,194·5 | 3,746·5 |
| 1967 .. | 2,784·8 | 507·8 | 2,276·9 | 1,500·0 | 25·7 | 271·6 | 0·1 | 4,582·2 | 4·074·3 |
| වෙනස (4) .. | + 310·2 | + 59·8 | + 250·3 | + 75·0 | −6·5 | + 9·0 | – | + 387·7 | + 327·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

\+ නිදන් අරමුදල් වෙනුවෙන් ඇති ආයෝජනවල වෙළෙඳ වටිනාකම පිළිබිඹු වෙයි (අතිරේක නිදන් අරමුදල් ඇතුළුව)

(2) ජා. මූ. අරමුදලට, ජා. ස. ප්‍ර. බැංකුවට සහ ජා. ස. ස. ට සාමාජික දයක මුදල් ගෙවීම සඳහා ලබා ගන්නා ලද 1966 සැප්තැම්බර් මසට රුපි. දශ ලක්ෂ 12·4 ක් වූද, 1967 සැප්තැම්බර් මසට රුපි. දශ ලක්ෂ 84·4 ක් වූද, විශේෂ ණය මුදල් ඇතුළත් වෙයි. මෙම විශේෂ ණය මුදල් හැරුණවිට. මුදල් වර්ෂය තුළ දී මහ බැංකු අත්තිකාරම් රුපි. දශ ලක්ෂ 7·0 කින් වැඩිවිය.

(3) 1966 සහ 1967 සැප්තැම්බර් අවසාන වනවිට නිකුත් වූ සහ නොබේරන ලද ජාතික සංවර්ධන පිළිනපත් වල වටිනාකම පිළිවෙළින් රුපි. 70,802 ක් සහ රුපි. 67,542 ක්ද විය.
දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද මෙම පිළිනපත් වාර්ෂිකව සියයට 5 ක ව්‍යවස්ථානුගත පොළී රටාවකින් යුක්තය.

(4) + ලකුණෙන් වැඩිවීමක් දැක්වෙයි.

1967 සැප්තැම්බර් 30 දිනට දළ දේශීය ණයෙහි පරිනතවීමේ රටාව, ඉකුත් වර්ෂ සතරේ අනුරූප සංඛ්‍යා තොරතුරු ද සහිතව 11 (ඉ) 11 වැනි සංඛ්‍යා සටහනෙන් පෙන්වා දී ඇත. දේශීය ණයෙහි කාලීන ව්‍යුහය ඉකුත් මුදල් වර්ෂ තුන තුළදී දීඝී වූ බව 1966 වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. මෙම ප්‍රවනතාවය 1966/67 මුදල් වර්ෂයේ ද තවදුරටත් පැවතුනි. අවුරුදු විස්සකට අධික පරිනත වීමේ කාලයක් සහිත දේශීය ණය, මුළු දේශීය ණයෙන් සියයට 31·7 ක් විය; මෙය මුදල් වර්ෂය තුළ ඇති වූ සියයට 5·0 ක වැඩි වීමකි. අරමුදල් නොකළ ණය කොටස සියයට 1·8 කින් පහළ වැටුනු අතර, එම කොටස 1967 සැප්තැම්බර් අවසානයේ දී, මුළු ණයෙන් සියයට 39·2 ක් විය.

**රුපියල් සුරැකුම්පත්:**

විමර්ශනයට භාජන වී ඇති මුදල් වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ 390·8 ක ප්‍රමාණයක රුපියල් ණය මුදල් පහළොවක් නිකුත් කරනු ලැබිය. මෙයින් රුපියල් දශ ලක්ෂ 50·9 ක ප්‍රමාණයකින් යුත් ණය මුදල් තුනක්, පරිවර්තන ණය මුදල් වූ අතර, රුපියල් දශ ලක්ෂ 3·6 ක ප්‍රමාණයක් අවුරුදු 5 සිට 7 දක්වා වන සියයට $3\frac{1}{2}$ ණය මුදල් විය. රුපියල් දශ ලක්ෂ 336.3 ක ඉතිරි (අවුරුදු 21 සිට 25 දක්වා වන) ණය මුදල් එකොළහද, සියයට $4\frac{1}{2}$ මුදල් නිකුතු විය. පරිවර්තන ණය මුදල් හැරුනු විට, රුපියල් සුරැකුම්පත් මාගීයෙන් ලබාගත් සම්පත් රුපියල් දශ ලක්ෂ 340.0 ක් විය. පරිවර්තන ණය මුදල් තුනෙන්, 1970/72 කාලය දක්වා වූ සියයට $3\frac{1}{4}$ ණය මුදල ලබාගත්තේ, 1965/67 හේ සියයට $3\frac{1}{4}$ ණය මුදල් කොටස් පරිවර්තනයෙනි. 1972/75 කාලය දක්වා වූ සියයට $3\frac{1}{2}$ ණය මුදල ලබාගත්තේ 1965/67 සියයට $2\frac{3}{4}$ ණය මුදල පරිවර්තනය කිරීමෙනි.

## සංඛ්‍යා සටහන II (ඉ) 11

## දේශීය ණය — පරිනතවීම අනුව විග්‍රහ කිරීම

### (සැප්තැම්බර් අවසානයේ දී)

රුපියල් දශ ලක්ෂ

| පරිනතවීමේ වර්ෂ | 1963 | | 1964 | | 1965 | | 1966 | | 1967 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| නිස්සදනන ණය† .. | 1,346·6 | 44·4 | 1,465·9 | 43·4 | 1,545·9 | 41·8 | 1,719·8 | 41·0 | 1,797·4 | 39·2 |
| සදනන ණය–අවුරුදු 5 ට අඩු* .. | 246·2 | 8·1 | 205·8 | 6·1 | 245·5 | 6·6 | 292·1 | 7·0 | 252·6 | 5·5 |
| අවුරුදු 5 හා 10 අතර* .. | 365·4 | 12·1 | 445·0 | 13·2 | 393·3 | 10·6 | 354·5 | 8·5 | 367·7 | 8·0 |
| අවුරුදු 10 හා 15 අතර* .. | 222·9 | 7·4 | 216·6 | 6·4 | 336·6 | 9·1 | 386·0 | 9·2 | 386·0 | 8·4 |
| අවුරුදු 15 හා 20 අතර* .. | 249·1 | 8·2 | 247·0 | 7·3 | 127·1 | 3·4 | 324·1 | 7·7 | 324·1 | 7·1 |
| අවුරුදු 20 ට වැඩි* .. | 600·0 | 19·8 | 795·0 | 23·0 | 1,048·1 | 28·4 | 1,118·0 | 26·7 | 1,454·4 | 31·7 |
| එකතුව .. | 3,030·2 | 100·0 | 3,375·3 | 100·0 | 3,695·5 | 100·0 | 4,194·5 | 100·0 | 4,582·2 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

† භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත, මහ බැංකු අත්තිකාරම් හා ජාතික සංවර්ධන පිළිනපත් වලින් සමන්විත වේ.

* පරිනතවීමේ අවසාන දිනට.

## සංඛ්‍යා සටහන II (ඉ) 12

## 1966/67 වර්ෂයෙහි රජයේ සුරැකුම් පත්වල දායකත්වය වර්ග කිරීම

රුපි. දශ ලක්ෂ

| | 1987/91 'එච්' කාණ්ඩය 4½% ණය | 1987/91 'අයි' කාණ්ඩය 4½% ණය | 1987/91 'ජේ' කාණ්ඩය 4½% ණය | 1988/92 4½% ණය | 198‑/92 'බී' කාණ්ඩය 4½% ණය | 1970/72 * 3¼% ණය | | 1922/74 3½% ණය | 1988/92 'සී' කාණ්ඩය 4½% ණය | 1988/82 'ඩී' කාණ්ඩය 4½% ණය | 1988/92 'ඊ' කාණ්ඩය 4½% ණය | 1972/75† 3¼% ණය | | 1988/92 'එෆ්' කාණ්ඩය 4½% ණය | 1970/71†† 3¼% ණය | | 1988/92 'ජී' කාණ්ඩය 4½% ණය | 1988/92 'එච්' කාණ්ඩය 4½% ණය | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | හැරවුම් | මුදල් | | | | | හැරවුම් | මුදල් | | හැරවුම් | මුදල් | | | | |
| වෙළෙඳ බැංකු .. .. | — | — | — | — | — | 6·0 | — | 2·0 | — | — | — | 2·2 | — | — | 3·3 | — | — | — | 13·5 | 3·5 |
| සමුපකාර බැංකු .. .. | — | — | — | — | — | — | — | — | — | — | 0·3 | — | — | — | — | — | — | — | 0·3 | 0·1 |
| ඉතිරි කිරීමේ ආයතන .. | 1·6 | 27·9 | 4·0 | 3·2 | 5·2 | — | — | — | — | 0·8 | 12·9 | — | — | 8·1 | — | — | 11·1 | — | 74·8 | 19·1 |
| නිදන් අරමුදල් .. .. | 12·5 | 6·8 | 2·9 | 10·1 | 5·8 | — | 13·8 | — | 10·0 | 2·3 | — | — | 7·1 | — | — | 16·2 | 6·4 | 2·4 | 96·3 | 24·6 |
| දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. | 1·6 | — | 0·3 | — | 1·3 | — | — | 0·1 | — | 2·5 | 2·5 | 0·2 | — | 0·3 | — | — | 1·4 | — | 10·2 | 2·6 |
| භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් | | | | | | | | | | | | | | | | | | | | |
| 1. සේවක අර්ථසාධක අරමුදල | 8·2 | 6·0 | 6·4 | 5·6 | 7·7 | — | — | — | 14·3 | 6·0 | 7·0 | ... | — | 10·8 | — | — | 9·3 | 4·0 | 85·3 | 21·8 |
| 2. අනෙකුත් .. .. | 5·5 | 2·8 | 6·2 | 2·8 | 4·7 | ... | 0·1 | 0·1 | 2·4 | 3·6 | 3·3 | — | 0·1 | 6·1 | 1·5 | — | 1·9 | 2·0 | 43·1 | 11·0 |
| රක්ෂණ අරමුදල්:– | | | | | | | | | | | | | | | | | | | | |
| 1. රක්ෂණ සංස්ථාව .. | 4·0 | 3·0 | 3·5 | 7·5 | — | — | — | 1·0 | 3·0 | 6·5 | 7·5 | — | — | 2·9 | — | — | 3·0 | 6·0 | 47·9 | 12·3 |
| 2. රක්ෂණ සමාගම් .. | 1·2 | 1·7 | 1·4 | — | 0·1 | 0·1 | — | 0·1 | — | 2·1 | 0·4 | — | — | 1·5 | 0·1 | — | 1·5 | 0·4 | 10·6 | 2·7 |
| අනෙක් සමාගම් .. | ... | — | — | ... | ... | — | — | — | 0·1 | ... | ... | — | — | 0·1 | — | | 0·1 | — | 0·3 | 0·1 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන | 0·3 | 1·8 | 0·4 | 0·9 | 0·2 | ... | ... | 0·3 | 1·7 | 1·2 | 1·2 | — | ... | 0·3 | — | — | 0·3 | 0·3 | 8·9 | 2·3 |
| එකතුව .. | 35·0 | 50·0 | 25·0 | 30·0 | 25·0 | 6·2 | 13·9 | 3·6 | 31·4 | 25·0 | 35·0 | 2·4 | 7·2 | 30·0 | 5·0 | 16·2 | 35·0 | 15·0 | 390·8 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* 1967 මාර්තු මාසයේ ගෙවීමට නියමිතව තිබූ 1965/67 3¼% ණය මුදලේ කොටස් පරිවර්තනය සඳහා ලබාගන්නා ලදී.
† 1967 ජූලි මාසයේ ගෙවීමට නියමිතව තිබූ 1965/67, 2¼% ණය මුදලේ කොටස් පරිවර්තනය සඳහා ලබාගන්නා ලදී.
†† 1967 අගෝස්තු මාසයේ ගෙවීමට නියමිතව තිබූ 1965/67 'බී' කාණ්ඩයේ, 3¼% ණය මුදලේ කොටස් පරිවර්තනය සඳහා ලබාගන්නා ලදී.
** ඉතිරි කිරීමේ ආයතන දරූ මහ බැංකු සුරැකුම්පත්, මහ බැංකුව විසින් ආපසු මිල දී ගැනීමෙන් පසු, එම ආයතන විසින් මිල දී ගන්නා ලද ආණ්ඩුවේ සුරැකුම් පත්වල වටිනාකම වූ රුපි. දශ ලක්ෂ 53·4 ක මුදල ද ඇතුළත්ය.

1970/71 කාලය දක්වා වූ සියයට 3¼ ණය මුදල ලබාගත්තේ, එම වර්ෂය තුළ දී පරිනත වූ 1965/67 තේ (ආ) කාණ්ඩයේ සියයට 3¼ ණය කොටස් පරිවර්තනය කිරීමෙනි. අනෙකුත් ණය මුදල් 12 ම මුදල් සඳහා නිකුත් කරන ලදී. සුරැකුම් පත් බෙදී ගිය අයුරු 11 (ඉ) 12 වැනි සංඛ්‍යා සටහනෙහි වර්ග කොට ඇත.

11 (ඉ) 12 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදී සුරැකුම් පත් මුළු ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 96.3 (සියයට 24·6) ක් නිදන් අරමුදල් මගින් උපයා ගෙන ඇත. අනෙකුත් ප්‍රධාන දායකයන් සුරැකුම් පත් ගෙන ඇත්තේ මෙසේය. [1]සේවක අර්ථ-සාධක අරමුදල රුපියල් දශ ලක්ෂ 85 3 (සියයට 21·8), ඉතිරි කිරීමේ ආයතන රුපියල් දශ ලක්ෂ 74·8 (සියයට 19.1), රක්ෂණ සංස්ථාව රුපියල් දශ ලක්ෂ 47·9 (සියයට 12.3), භ රකාර මණ්ඩල, සේවක අර්ථසාධක අරමුදල හැර, සුභසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් රුපියල් දශ ලක්ෂ 43.1 (සියයට 11.0).

1965/66 දි සහ 1966/67 දී රජයේ සුරැකුම්පත් හිමිකම බෙදීගිය අයුරු ඉකුත් මුදල් වර්ෂ තුනෙහි අනුරූප සංඛ්‍යා තොරතුරු හා සමඟ 11 (ඉ) 13 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ඉකුත් මුදල් වර්ෂ පහ තුළ දී සුරැකුම් පත් හිමිකම බෙදී ගිය ආකාරයෙහි වැදගත් ලක්ෂණයක් වූයේ අබැංකු රාජ්‍ය අංශය මගින් දරන සැලකිය යුතු කොටසය.[2] 1962/63 සිට 1966/67 දක්වා කාල සීමාව තුළ, මෙකී ආයතන ආයෝජකයන්ගේ දැරීම් රුපියල් සුරැකුම්පත් වලින් සියයට 69 දක්වා වැඩි වී ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ රක්ෂණ සංස්ථාව විසින් සපයන ලද සම්පත් සීඝ්‍රයෙන් වැඩි වී ඇත. ඇත්ත වශයෙන්ම දැනට රජයේ සුරැකුම් පත් වැඩිම ප්‍රමාණයක් දරන්නා වී ඇත්තේ සේවක අර්ථසාධක අරමුදලයි.

## සංඛ්‍යා සටහන II (ඉ) 13

### 1962/63 සිට 1966/67 දක්වා රුපියල් සුරැකුම්පත්වල හිමිකම් බෙදීගිය අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | 1963/64 | 1964/65 | 1965/66 | 1966/67 |
|---|---|---|---|---|---|
| (අ) බැංකු අංශය .. .. | 304·0 | 329·5 | 326·0 | 324·5 | 281·2 |
| මහ බැංකුව .. .. | 11·5 | 8·1 | 8·0 | 8·0 | 7·4 |
| වෙළෙඳ බැංකුව .. .. | 292·6 | 320·4 | 318·0 | 316·4 | 273·7 |
| (ආ) බැංකු නොවන අංශ .. | 1,379·5 | 1,580·0 | 1,823·6 | 2,150·2 | 2,503,6 |
| ඉතිරිකිරීමේ ආයතන .. | 408·2 | 435·6 | 474·4 | 511·6 | 600·5 |
| නිදන් අරමුදල් .. .. | 219·8 | 256·2 | 302·5 | 407·0 | 474·2 |
| දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. | 97·9 | 107·5 | 121·8 | 123·8 | 140·0 |
| සේවක අර්ථසාධක අරමුදල .. | 222·8 | 287·8 | 360·1 | 434·8 | 519·8 |
| රක්ෂණ සංස්ථාව .. .. | 16·4 | 45·4 | 87·6 | 133·8 | 181·6 |
| අනෙකුත් රජයේ සංස්ථා .. | – | 3·5 | 3·5 | 3·5 | 2·9 |
| සමුපකාර බැංකු .. .. | 9·7 | 9·7 | 7·0 | 7·0 | 7·3 |
| වෙනත්* .. .. | 404·8 | 434·2 | 466·7 | 528·7 | 577·2 |
| | 1,683·6 | 1,909·4 | 2,149·6 | 2,474·6 | 2,784·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල්, රක්ෂණ සමාගම්, අනෙක් සමාගම්, සමාජ ආයතන සහ පුද්ගලයින්ගෙන් සමන්විතය.

1. තැපැල්කන්තෝරු ඉතිරිකිරීම් බැංකුව, ලංකා ඉතිරිකිරීම් බැංකුව සහ ඉතිරි කිරීම් සහතිකපත් අරමුදල සමන්විත වේ. මෙම එකතුවට, ඉතිරි කිරීමේ ආයතන විසින් දරන මහ බැංකු සුරැකුම්පත් නැවත මහ බැංකුව විසින් මිලදී ගැනීමේ හේතුවෙන්, ඔවුන් විසින් මිලදී ගත් රුපියල් දශ ලක්ෂ 53.4 ක රජයේ සුරැකුම්පත් ප්‍රමාණයක් අන්තර්ගතය.
2. ඉතිරි කිරීමේ ආයතන නිදන් අරමුදල්, දෙපාර්තමේන්තු අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල්, රක්ෂණ සංස්ථාව සහ අනිකුත් රජයේ සංස්ථාවන් මගින් නිරූපනය කර ඇති පරිදි.

1963 ජූනි මස 1 වෙනිදින සියයට $4\frac{1}{4}$ සිට $4\frac{1}{2}$ දක්වා වැඩි කරන ලද, රජයේ දීර්ඝ කාලීන ණය මුදල් වල (අවුරුදු 21 සිට 25) පොලිය, එදින සිට එම මට්ටමේම පැවතුනි.

**භාණ්ඩාගාර බිල්පත්**

1966/67 මුදල් වර්ෂය ආරම්භයේ දී නොබේරා තිබුණු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1425.0 ක් විය. එදිනට බලය ලත් සීමාව රුපියල් දශ ලක්ෂ 1500·0 ක් වුණි. මුදල් වර්ෂය අවසන් වන විට, නිකුත් කොට නොබේරා තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1500·0 ක් වූයෙන්, මුදල් වර්ෂය තුළ වූ වැඩි වීම රුපියල් දශ ලක්ෂ 75·0 ක් වූ අතර, දැනට පවත්නා බිල්පත් නිකුත් කළ හැකි බලය ලත් සීමාවෙන්, ප්‍රයෝජනයකට නොගෙන [1]ඉතිරි වූ ශේෂයක් නොවිනි.

1967 සැප්තැම්බර් අවසානයේ දී බැංකු ක්‍රමය විසින් දරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1456·7 (මෙය නොබේරා තිබුණු මුළු ප්‍රමාණයෙන් සියයට 97·1) ක් වූ අතර, 1966 සැප්තැම්බර් 30 දින පැවති රුපියල් දශ ලක්ෂ 1369·3 (සියයට 96·1) හා සැසඳේ. මෙම මුළු ගණනින් 1967 සැප්තැම්බර් අවසානයේ දී, මහ බැංකුව දැරූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1377.2 (නොබේරා තිබුණු මුළු ප්‍රමාණයෙන් සියයට 91·8) ක් වූ අතර, 1966 සැප්තැම්බර් 30 වැනි දා පැවති රුපියල් දශ ලක්ෂ 1257·9 (සියයට 88·3) හා සැසඳේ.

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ සියයට 3·0 වාර්ෂික පොලී අනුපාතිකයෙහි වෙනසක් නොවීය. භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ මහ බැංකු සහාය, මුදල් වර්ෂය මුළුල්ලේම වාර්ෂිකව සියයට 1·0 ක ප්‍රමාණයේ පැවතුනි.

**බදු සංචිත සහතික**

නිකුත් කිරීමට බලය ඇති බදු සංචිත සහතික ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 250·0 න්, 1967 සැප්තැම්බරය අවසන් වනවිට, රුපියල් දශ ලක්ෂ 240.7 ක් වටිනා සහතික පත් ප්‍රමාණයන් නිකුත්කොට තිබුණි. නිකුත්කොට ඇති සහතික පත් වලින් භාර නොදෙන ලද ප්‍රමාණය එදින දී රුපියල් දශ ලක්ෂ 25·7 ක් විය. ඉකුත් මුදල් වර්ෂය අවසානයේ දී භාර නොදෙන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 32·2 ක් වූ අතර, මෙහි ප්‍රතිඵලය වූයේ මේ ගනයේ ණය ගැතිවීම්වල රුපියල් දශ ලක්ෂ 6·5 ක පිරිහීමකි.

1961 අගෝස්තු මාසයේ දී සියයට 1 සිට සියයට $1\frac{1}{2}$ දක්වා වැඩි කරන ලද බදු සංචිත සහතික සම්බන්ධයෙන් වූ පොලී අනුපාතිකය, එතැන් සිට එම මට්ටමේම පැවතුනි.

**මහ බැංකු අත්තිකාරම්**

මුදල් නීති පනතේ 89 වැනි ඡේදය යටතේ රජය වෙත සපයන ලද අත්තිකාරම් ප්‍රමාණය 1965/66 වර්ෂය අවසන් වන විට, රුපියල් දශ ලක්ෂ 262·6 ක් වී තිබුණි. 1967 සැප්තැම්බර් මස අග දී මෙම අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 271·5 ක් වූ හෙයින්, සැලකිල්ලට භාජනය වී ඇති මුදල් වර්ෂය තුළ දී මෙම අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 9.0 කින් වැඩි වී ඇත. ජාත්‍යන්තර මුදල් ආයතන වලට ගෙවිය යුතු වූ ලංකාවේ දායක මුදල් සඳහා ලබාගන්නා ලද, පිළිවෙලින්

1. 1968 ජනවාරි 27 වැනිද පාර්ලිමේන්තුව විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේ බලය ලත් සීමාව, රුපියල් දශ ලක්ෂ 1,750 දක්වා, රුපියල් දශ ලක්ෂ 250 කින් ඉහල දමන ලදී.

රුපියල් දශ ලක්ෂ 82·4 ක සහ රුපියල් දශ ලක්ෂ 84·4 ක විශේෂ ණය මුදල්, එක් එක් වර්ෂයේ අවසානයේ අනුකූල සංඛ්‍යා වලට ඇතුලත්ව ඇත. මෙම ගෙවීම් හැරුන 1966/67 දී මහ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 7.0 කින් වැඩි විය.

විදේශ ණය

1966/67 වර්ෂයේ දී දළ විදේශීය ණය (ආපසු ගෙවීම් හැර, එහෙත් නිදන් අරමුදල් සඳහා වූ අඩු කිරීම් වලට පෙර) රුපියල් දශ ලක්ෂ 190·5 කින් වැඩි වූ අතර, 1966/67 වර්ෂයේ දී මෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 59·5 ක් විය. සැලකිල්ලට භාජනය වී ඇති මුදල් වර්ෂය තුළ මුළු හැර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 236·2 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 42.3 ක් ව්‍යාපාර සඳහා ගත් ණය මුදල් විය. රුපියල් දශ ලක්ෂ 193.9 ක් වූ ශේෂය ලංකාවට සපයන ලද භාණ්ඩ ණය යටතේ වූ විදේශීය වගකීම් විය. මුදල් වර්ෂය තුල දී වූ නැවත ගෙවීම්, මුළු මණින්ම වාගේ යෝජනා ක්‍රම වගකීම් ණය වලට සීමා වූ අතර, එසේ ගෙවූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 45·7 ක් විය. එහෙයින් දළ විදේශීය ණය (ආපසු ගෙවීම් හැර එහෙත් නිදන් අරමුදල් සඳහා යොමු කිරීමට පෙර) පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 59·5 කින් වූ වැඩිවීම හා බලන විට 1966-67 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 190·5 කින් වැඩි වී ඇත.

සංඛ්‍යා සටහන II (ඉ) 14

විදේශීය ණය

රුපියල් දශ ලක්ෂ

| | 1966/67දී ආපසු ගැනීම | 1966/67දී නැවත ගෙවීම | 1966/67දී වැඩිවීම* | 1967 සැප්තැම්බර් 30 වැනි දිනට වගකීම |
|---|---|---|---|---|
| (අ) රන්පවුම් ණය .. | – | – | – | 83·3† |
| (ආ) යෝජනා ක්‍රම ණය | | | | |
| (1) ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකු ණය | 6·6 | 7·0 | – 0·4 | 138·1 |
| (2) ඇමෙරිකානු එක්සත් ජනපදයේ අයි. සී. ඒ. ණය .. | – | 0·4 | – 0·4 | 52·5 |
| (3) ඇමෙරිකානු එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදලේ ණය .. | – | 1·0 | – 1·0 | 8·7 |
| (4) ඇමෙරිකානු එක්සත් ජනපදයේ ඒ. අයි. ඩී. ණය .. | – | – | – | 7·0 |
| (5) බටහිර ජර්මන් (ක්‍රෙඩිටැන්ස්ටෝල්ට්) ණය .. | 18·6 | 4·3 | 14·2 | 38·9 |
| (6) එක්සත් රාජධානියේ ණය මාලාව .. | 2·0 | 5·9 | – 3·9 | 16·3 |
| (7) සෝ. ස. ස. සං. ණය මාලාව .. | 1·5 | 11·5 | –10·0 | 82·3 |
| (8) චීන ණය .. | – | 4·9 | – 4·9 | 45·3 |
| (9) කැනේඩියානු ණය .. | 5·7 | 1·2 | 4·5 | 7·9 |
| (10) කැනේඩියානු අ. ණ. ර. ස. ණය .. | 5·8 | 3·8 | 1·9 | 19·0 |
| (11) ප්‍රංශ එස් ඕ. සී. ඊ. ඒ. ණය .. | 0·5 | 1·5 | – 1·0 | 6·0 |
| (12) යුගෝස්ලේවියානු ණය මාලාව .. | .... | 1·5 | – 1·4 | 3·4 |
| (13) පෝලන්ත ණය මාලාව .. | 0·5 | 0·5 | ... | 2·5 |
| (14) ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ ණය මාලාව .. | 1·1 | – | 1·1 | 1·1 |
| (ඇ) භාණ්ඩ ණය | | | | |
| (1) ඇමෙරිකානු එක්සත් ජනපද ඒ. අයි. ඩී. ණය .. | 32·4 | – | 32·4 | 32·4 |
| (2) බටහිර ජර්මන් (ක්‍රෙඩිටැන්ස්ටෝල්ට්) ණය .. | 52·0 | – | 52·0 | 53·2 |
| (3) එක්සත් රාජධානි ණය .. | 54·5 | – | 54·5 | 73·4 |
| (4) කැනේඩියානු ණය .. | 1·7 | – | 1·7 | 4·1 |
| (5) ප්‍රංශ රජයේ ණය .. | 11·9 | – | 11·9 | 11·9 |
| (6) ජපන් ණය .. | 31·3 | – | 31·3 | 41·4 |
| ඉන්දියානු රජයේ ණය .. | 10·1 | 2·1 | 8·0 | 10·6 |
| එකතුව .. | 236·2 | 45·7 | 190·5 | 739·3† |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* එනම්: නැවත ගෙවීම් හැර ආපසු ලබා ගැනීම.

† ස්ටර්ලින් පවුම් සුරැකුම්පත් නිදහස් කිරීම සඳහා පටන්වා ගන්නා නිදන් අරමුදල් රුපියල් දශ ලක්ෂ 31·3 ක් විය. මෙම නිදන් අරමුදල් සඳහා ගැලපීම් කළ විට ශුද්ධ වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 703·0 ක් වෙයි.

– සලකුණෙන් ශුද්ධ ආපසු ගෙවීම් දැක්වෙයි.

**යෝජනාක්‍රම ණය**

පොදු අංශයේ යෝජනා ක්‍රම සඳහා, යෝජනාක්‍රම ණය ස්වරූපයෙන් ලැබුණු විදේශාධාර සහ එසේ ලැබුණු විදේශාධාර; වලින් උපයෝගී කොට ගත් ප්‍රමාණය 1966/67 දී රුපියල් දශ ලක්ෂ 42·3 විය. එම මුදල් වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ 43·5 මුදල් ප්‍රමාණයක් නැවත ගෙවීම නිසා, යෝජනා ක්‍රම ණය ගිණුමේ රුපියල් දශ ලක්ෂ 1·2 කින් විදේශීය වගකීම්වල ශුද්ධ අඩුවීමක් ඇතිවිය. පොදු අංශයට සපයනු ලබන විදේශීය යෝජනාක්‍රම ආධාරවල වැදගත්කම අඩු වූ ආකාරය 1964/65 වර්ෂයෙහි යෝජනාක්‍රම ආධාර ප්‍රමාණයෙහි ශුද්ධ වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 77·9 හා 1965/66 දී ශුද්ධ වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 48·9 හා බලන කල පැහැදිලි වේ.

11 (ඊ) 14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි, සිමෙන්ති කර්මාන්තය; යකඩ වාත්තු කිරීමේ කර්මාන්ත ශාලාව සහ කොළඹ වරාය සංවර්ධනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 18·6 වශයෙන් වූ) උපයෝගී කොට ගන්නා ලද යෝජනා ක්‍රම ආධාර වලින් ප්‍රධාන කොටස පැමිණියේ බටහිර ජර්මනියෙනි. ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවෙන් "නෝර්ටන් බ්‍රිජ්හි" ජලවිදුලි යෝජනා ක්‍රමය සහ "ග්‍රෑන්ඩ්පාස්හි" තාපබල යෝජනා ක්‍රමය සඳහා (රුපියල් දශ ලක්ෂ 6·6) ක් ද; කැනඩාවෙන්, මස්කෙළියාව ජලවිදුලි යෝජනා ක්‍රමය සහ කටුනායක ගගන යානා තොටුපල සංවර්ධනය කිරීමට ඉංජිනේරු සේවා සහ උපකරණ සම්පාදනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 11·5) ක් ද ලැබිණ.

**භාණ්ඩ ණය**

භාණ්ඩ ණය වශයෙන් සපයනු ලබන විදේශාධාර ප්‍රථම වරට ලැබුණේ 1965/66 වර්ෂයේදීය. එය, යෝජනාක්‍රම ණය වලින් වෙනස් වන්නේ, පෞද්ගලික අංශයට සපයනු ලබන ආධාර වලින් ප්‍රධාන වශයෙන් සැකසෙන හෙයිනි. 1965/66 මුදල් වර්ෂයේ දී වූ විදේශීය වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 35.2 ක් විය.[1] එම වර්ෂයේ විදේශාධාර, ප්‍රධාන වශයෙන්ම එක්සත් රාජධානියෙන් පැමිණි (රුපියල් දශ ලක්ෂ 18.9) පොහොර, වාහන හා අමතර කොටස් සහ මූලික ලෝහ, වලින්ද, ජපානයෙන් (රුපියල් දශ ලක්ෂ 10·3) පොහොර, රෙදිපිළි, මෝටර් රථ ටයර් සහ ටියුබ් වලින් සහ ඉන්දියාවෙන් (රුපියල් දශ ලක්ෂ 2.6) වියළි මිරිස් හා රෙදිපිළි වලින් ද සැකසුනි.

1966/67 මුදල් වර්ෂය තුළ දී උපයෝගී කොට ගත් භාණ්ඩ ආධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 193·9 දක්වා සැලකිය යුතු ලෙසට ඉහල ගියේය. කාර්මික අමු ද්‍රව්‍ය සහ පෝර වර්ග ආනයනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 64·5) එක්සත් රාජධානියෙන්ද; පෝර වර්ග සහ මෝටර් රථ උපකරණ ආනයනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 52.0) බටහිර ජර්මනියෙන්ද; පෝර වර්ග සහ මෝටර් උපකරණ ආනයනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 32.4) එක්සත් ජනපදයෙන්ද; රෙදි පිළි සහ මෝටර් රථ උපකරණ සහ අමතර කොටස් ආනයනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 31·3) ජපානයෙන්ද; රථ වාහන සහ මෝටර් උපකරණ ආනයනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 11·9) ප්‍රංශයෙන්ද; රෙදි පිළි ආනයනය කිරීම සඳහා (රුපියල් දශ ලක්ෂ 10·1) ඉන්දියාවෙන් ද ලැබුණ ණය මුදල්, මෙහි ප්‍රධාන වශයෙන් ඇතුළත් විය.

---

1 ii (ඊ) සංඛ්‍යා සටහනේ 1 ශීර්ෂයේ 2 ඇ (ii) බලන්න.

ඉන්දීය රජයෙන් ගත් රුපියල් දශ ලක්ෂ 2·1 ණය මුදල ආපසු ගෙවීමෙන් පසු, 1966/67 මුදල් වර්ෂය අවසානයේ දී, භාණ්ඩ ණය සම්බන්ධයෙන් ඉතිරිව පැවති විදේශීය වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 227·0 විය. මෙම මුදල එම දිනය වන විට පැවති මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 30 කටත් වඩා වැඩි විය.

විමර්ශනයට භාජනය වී ඇති කාලය තුළ දී ඇතිවුණු රුපියල් ප්‍රතිපාර්ශ්වීය අර මුදල් සහ එම අරමුදල් අය-වැය කටයුතු සඳහා උපයෝගී කොට ගැනීම 11 පරිශිෂ්ටයෙහි 27 වන සංඛ්‍යා සටහනෙන් සම්පිණ්ඩනය කොට දක්වා ඇත.[1] 1965/66 මුදල් වර්ෂය අවසානය වන විට මෙම ගිණුමට රුපියල් දශ ලක්ෂ 36·9 ක ප්‍රමාණයක් බැර කර පැවති අතර, රජයෙන් දා කිසිදු ආපසු ගැනීමක් සිදු නොවිණි. 1966/67 මුදල් වර්ෂයේ දී මෙම ගිණුමට රුපියල් දශ ලක්ෂ 195.2 ප්‍රමාණයක් දක්වා බැර කිරීම් සිදුවිය. මෙම මුදල් වර්ෂයේ දී අය-වැය කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 150·0 උපයෝගී කොට ගැනීම නිසා, ගිණුමෙහි වූ මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 45·2 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 82·1 දක්වා ඉහළ ගියේය.

**අධි රාජ්‍ය ආයතන විසින් ගත් ණය**

මහ බැංකුව, ලබාගත හැකි සියලුම සම්පත්, රජයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි යොමුකර වීමෙන් ද, රජයේ මුදල් තත්ත්වය සහ එම ආයතනයන්ගේ මුදල් අවශ්‍යතා අනුව, ජාතික නිවාස කොමසාරිස්වරයාට ණය අරමුදල් සපයන ලෙස රජයට උපදෙස් දෙමින් ද, පසුගිය මුදල් වර්ෂ හතරේදී ගත් ප්‍රතිපත්තියම අනුගමනය කළේය.

**1. ජාතික නිවාස දෙපාර්තමේන්තුව.**

1966/67 දී ජාතික නිවාස ණයකර නිකුත් නොකිරිනි; මෙතෙක් නොබේරද, නිකුත් කොට ඇති ජාතික නිවාස ණයකර වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 75·0 ව පැවතිණි. රජය විසින් අනුමත කරන ලද ඍජු ණය මුදල් ප්‍රමාණය 1967 සැප්තැම්බර් මස අවසාන වන විට රුපියල් දශලක්ෂ 26·0 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 121·0 දක්වා ඉහළ ගියේය. ජාතික නිවාස ණයකර බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදල් වල වටිනාකම රුපියල් දශලක්ෂ 37·4 වශයෙන් පැවතිණ.

**2. රජයේ උකස් බැංකුව.**

සැලකිල්ලට භාජන වී ඇති මුදල් වර්ෂයේදී රජයේ උකස් බැංකුව අලුත් ණයකර නිකුත්කර නොතිබුණි. මෙතෙක් නොබේරන ලද නිකුත් කොට ඇති ණයකරවල වටිනාකම රුපියල් දශලක්ෂ 33·3 ලෙසට පැවතිණි. මෙම මුදල් වර්ෂය තුළදී බැංකුවේ කටයුතු වලින් විශාල කොටසක් කරගෙන යන ලද්දේ බැංකු ක්‍රමය මගින් සලසා තිබූ අයිරා පහසුකම් මගිනි. රජයේ උකස් බැංකුවේ ණය ලබා ගැනීමේ සීමාව රුපියල් දශලක්ෂ 75·6 දක්වා; රුපියල් දශලක්ෂ 5·0 කින් වැඩි කරනු ලැබූ අතරා රජයේ උකස් බැංකු ආඥා පනතේ 73, 75 සහ 84 යන ඡෙද අනුව ඇපවුණු අයිරාවල අගය, මුදල් වර්ෂය අවසානය වන විට රුපියල් දශලක්ෂ 42·3 දක්වා ඉහළ යමින්, රුපියල් දශලක්ෂ 5·0 කින් වැඩිවිය. මෙතෙක් නොබේරන ලද, නිකුත් කළ ණයකර ප්‍රමාණය රුපියල් දශලක්ෂ 33·3 වීම නිසා, 1966/67 වර්ෂය අවසානයේදී ණය ලබා ගැනීමේ හැකියාව ඇතුළත ඉතිරි වූ ශේෂයක් නොවිය.

---

1. මෙම සංඛ්‍යා සටහනෙහි සහ ii (ඊ) 1 සහ ii (ඊ) ද 14 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන සංඛ්‍යා වල වෙනස්කම් මහ බැංකුවේ සහ ලංකාණ්ඩුවේ භාණ්ඩාගාරයේ ගිණුම තැබීමේදී පවත්නා පරතරයන් ලෙස පැහැදිලි කර දිය හැක.

**(ආ) කොටස - 1967/68 මුදල් වර්ෂය**
**1967//68 අයවැය ලේඛනය.**

1967 සැප්තැම්බර් මස 28 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 1967/68 මුදල් වර්ෂය සඳහා වූ අයභාරය හා වියදම පිළිබඳ මුල් ඇස්තමේන්තු පහත සඳහන් සංඛ්‍යා සටහනේ සාරාංශ වශයෙන් දක්වා ඇත.

**සංඛ්‍යා සටහන (II) (ඉ) 15**

**1967/68 මුල් අය වැය ඇස්තමේන්තු**

රුපියල් දශ ලක්ෂ

| | | | |
|---|---|---|---|
| (අ) | ආවර්තන වියදම් (වැය සම්මත 1,2,4 හා 6) .. .. | 2,204·8 | |
| | සියයට 2½ ඌන වියදම් හැර* .. .. .. | 51·9 | 2,152·9 |
| (ආ) | ප්‍රාග්ධන වියදම් (වැය සම්මත 3,5 හා 7) ,, ,, | 782·5 | |
| | සියයට 15 ඌන වියදම් හැර .. .. .. | 117·4 | 665·1 |
| (ඇ) | මුළු වියදම් [ (අ) + (ආ) ] .. .. .. | | 2,818·0 |
| (ඈ) | ආදායම් (නව බදු ලැබීම් ඇතුලත්වය .. .. | | 2,049·9 |
| (ඉ) | අය වැය හිඟය [ (අ) – (ඈ) ] .. .. .. | | 768·1 |
| (ඊ) | රාජ්‍ය ණයෙහි සෘජු ආපසු ගෙවීම් සහ නිදන් අරමුදල් සඳහා දයක දීමනා හැර .. | | 125·6 |
| (ඨ) | ඇස්තමේන්තු කල ශුද්ධ මුදල් හිඟය .. .. | | 642·5 |

මූලය: ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව

*. රුපියල් දශ ලක්ෂ 2,079·2 න් සියයට 2½ මෙම සංඛ්‍යාව ලබා ගත්තේ ආවර්තන වියදමෙන් නිදන් අරමුදල් දයක දිමනා හා ආදයමෙන් කෙරෙන සෘජු රාජ්‍ය ණය බේරීම (රුපියල් දශ ලක්ෂ 125·6) අඩු කිරීමෙනි.

රුපියල් දශ ලක්ෂ 768·1 ක් වූ අයවැය හිඟය පහත සඳහන් පරිදි පියවා ගත යුතුව තිබුණි.

රුපියල් දශ ලක්ෂ

| | | |
|---|---|---|
| (අ) | දේශීය ණය .. .. .. .. | 350·0; |
| (ආ) | විදේශාධාර (යෝජනා ක්‍රම) .. .. .. | 125·0; |
| (ඇ) | භාණ්ඩ ආධාර.ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ප්‍රයෝජනයට ගැන්ම .. | 150·0; |
| (ඈ) | පරිපාලන ණය ,. .. .. .. | 25·0; |
| (ඊ) | රජයේ සමායතන සහ ව්‍යාපාරවල ලාභ සහ සංචිත1 .. .. | 22·0; |

බැංකු ක්‍රමයෙන් ගත් ණය වලින් පියවා ගත යුතු, නොපුරවන ලද රුපියල් දශ ලක්ෂ 96·1 පරතරය අතහැර

1. රජයේ සංස්ථා සහ ව්‍යාපාරවල ලාභ සහ සංචිත වලින් රුපියල් දශ ලක්ෂ 30·0 ක් පාවිච්චි කිරීමට අය වැය කථාවෙන් බලාපොරොත්තු විය. රුපියල් දශ ලක්ෂ 8·0 අයභාරය වශයෙන් ඇතුළත් වීම නිසා, ඉතිරි රුපියල් දශ ලක්ෂ 22·0 අය වැය හිඟය පියවා ගැනීමේ ශීෂයක් ලෙස දක්වා ඇත.

## අයභාරය

අය වැය ලෙඛනයෙන් යෝජිත මාර්ග වලින් ලැබෙන රුපියල් දශ ලක්ෂ 118·0 ලැබීම් ඇතුළුව, 1967/68 වර්තමාන මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදයම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,049·9 විය. 1966/67 නියම අයභාර ප්‍රමාණය වූ (තාවකාලික) රුපියල් දශ ලක්ෂ 1,954·7 සමග සසඳ බලන කල, වර්තමාන මුදල් වර්ෂය සඳහා අය වැය ලේඛනයෙන් ඇස්තමේන්තු කළ අයභාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 95·2 කින් වැඩි වූ බව පෙනේ.

පසුගිය වර්ෂයේ නියම ආදයම් එකතුවට වඩා රුපියල් දශ ලක්ෂ 95·2 ක වැඩිවීමක් ඇස්තමේන්තු වූයේ ප්‍රධාන වශයෙන් සුරා බදු වලින් (රුපියල් දශ ලක්ෂ 30·5) ක් ද; බලපත්‍ර ආදියෙන් (රුපියල් දශ ලක්ෂ 65·4) ක් ද; තැපැල් හා විදුලි සංදේශ ලැබීම් වලින් (රුපියල් දශ ලක්ෂ 11·4) ක් ද; පොලී, වාර්ෂික ගෙවීම් සහ ලාභාංශ වලින් (රුපියල් දශ ලක්ෂ 10·1) ක් ද; විවිධ ලැබීම් වලින් රුපියල් දශ ලක්ෂ 37·3 ක් වශයෙන් ද බලාපොරොත්තු වූ අධික ආදයමේ ප්‍රමාණය හේතු කොට ගෙනයි. මේ

අතර රේගු බදු (රුපියල් දශ ලක්ෂ 21·2); වරාය ලැබීම් (රුපියල් දශ ලක්ෂ 3·9) සහ ආදායම් බදු ආදියෙන් (රුපියල් දශ ලක්ෂ 36·3) ලැබෙන ආදායම් වල අඩුවීම් වලින් මෙය තරමක් අඩුවිය.

### බදු යෝජනා සහ වෙනත් විධිවිධාන

අය වැය ලේඛනයේ අඩංගු වූ නව බදු යෝජනා සහ වෙනත් විධිවිධාන වලින් රුපියල් දශ ලක්ෂ 118 කින් අයභාරය වැඩිවීම හා රුපියල් දශ ලක්ෂ 60 කින් වියදම් වැඩිවීම යන ප්‍රතිඵල ඇතිවේ යයි බලාපොරොත්තු විණි.

රුපියල් දශ ලක්ෂ

| | අයභාරය | වියදම | |
|---|---|---|---|
| 1· ආනයන බලපත්‍ර ගාස්තු වැඩි කිරීම .. .. | + 80·0 | | |
| 2· දුම්කොළ සඳහාවූ බදු වැඩි කිරීම .. .. | + 15·0 | | |
| 3· ආදායම් බදු හිඟ මුදල් ඉක්මනින් ආපසු ලබා ගැනීම .. | + 15·0 | | |
| 4· රාජ්‍ය සංස්ථා සහ කළමනාවල ලාභ ආදායමට මාරු කිරීම .. | + 8·0 | | |
| 5· රජයේ සහ පළාත් පාලන සේවකයින්ට සහ විශ්‍රාමිකයන්ට දුන් අතුරු දීමනා .. | | – 60·0 | (වැඩිවීම) |
| එකතුව .. | + 118·0 | – 60·0 | |

### 1. ආනයන බලපත්‍ර ගාස්තු

සියයට 1 ක් වූ දැනට පවත්නා බලපත්‍ර ගාස්තුව (දැනට සියයට 10 ක බලපත්‍ර ගාස්තුවක් අය කරනු ලබන රෙදි පිළි හැර) සියයට 10 දක්වා වැඩි කරන ලදී.[1] මෙම වැඩි කිරීමෙන් සමහර භාණ්ඩ නිදහස් කරන ලදී. ඒවා නම්: කිරි; කිරි ආහාර; කුඩා දරුවන්ගේ සහ දුර්වලයන්ගේ ආහාර ද්‍රව්‍ය; කපුනූල්; බෙහෙත් වර්ග සහ බෙහෙත් පිළියෙල කිරීම සඳහා වූ ද්‍රව්‍ය; පොර වර්ග; භූමි තෙල්; මුද්‍රණ කඩදාසි; උදලු; සහ කෘෂි කාර්මික කටයුතු සඳහා වූ වෙනත් කුඩා උපකරණ වේ. ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව මගින් හා අනිකුත් රජයේ දෙපාර්තමේන්තු මගින් ගෙන්වන ලද ආනයනයන් සාවදුරටත් බලපත්‍ර ගාස්තුවෙන් මුළුමනින්ම නිදහස්ව පැවතුනි. මෙම පිළිවෙතින් රුපියල් දශ ලක්ෂ 80 ක අතිරේක අයභාර ප්‍රමාණයක් ලබා ගැනීමට බලාපොරොත්තු වුනි.

### 2. දුම්කොළ බද්ද

රාත්තලකට රු. 28·50 ක්වූ දුම්කොළ තීරු බද්ද රාත්තලකට රුපියල් 4·50 කින්[2] ඉහළ දමනු ලැබිය. මෙ මගින් රුපියල් දශ ලක්ෂ 15 ක අතිරේක අයභාරයක් බලාපොරොත්තු වුනි.

### 3. අයබදු හිඟ මුදල් වඩා ඉක්මනින් ලබා ගැනීම.

අයබදු හිඟ මුදල් වඩා ඉක්මනින් ලබා ගැනීමෙන්, රුපියල් දශ ලක්ෂ 15 ක අතිරේක ආදායමක් බලාපොරොත්තු වුනි. මෙ කාර්‍යය සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙහි එකතු කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම අවශ්‍ය විය.

### 4. රජයේ සංයුක්ත මණ්ඩලවල හා කළමනාවල සංචිත හා ලාභ ප්‍රයෝජනයට ගැනීම.

රාජ්‍ය සංයුක්ත මණ්ඩලවල හා කළමනාවල සංචිත හා ලාභ වලින් රජය, රුපියල් දශ ලක්ෂ 30 ක ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු

1. 1967 ජුලි 26, නො: 14,758/8, 1967 අගෝස්තු 9 නො: 14760/6 සහ 1967 සැප්තැම්බර් 4 නො. 14764/6 ආණ්ඩුවේ ගැසට් පත්‍රය.
2. 1961 ජුලි 25 වෙනි දින, නො. 14,758/6 දරණ ගැසට් පත්‍රය.

විය. මෙම ප්‍රමාණයෙන්, රුපියල් දශ ලක්‍ෂ 8 ක්[1] රජයේ අයභාරයට උපචිත කරනු ලැබිය යුතු වූ අතර, රුපියල් දශ ලක්‍ෂ 22 ක්වූ ශේෂය අය වැය හිඟය පියවීම පිණිස වෙන් කල යුතු විය.

### 5. ව්‍යාපාර පිරිවැටුම් බද්ද

සමහර කුඩා කර්මාන්තයන් වන තේ පෙට්ටි, සුරුට්ටු, ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය, හඳුන්කූරු, කරවල සහ ගඩොල් කර්මාන්තවලට, පිරිවැටුම් බද්ද පැනවීම් මෙන් නැගී ඇති නොයෙකුත් දුෂ්කරතාවයන් සම්බන්ධයෙන් නියෝජනය කිරීම් සිදු විය. මෙම කර්මාන්තයන්හි, නිෂ්පාදනය සිදුවන්නේ ප්‍රධාන වශයෙන් ශ්‍රමිකයන් යෙදවීමෙන් මිස සැලකිය යුතු අන්දමින් යන්ත්‍රසූත්‍ර යෙදවීමෙන් නොවේ. දුෂ්කර-තාවයන් සැහැල්ලු කිරීමේ අදහස ඇතිව, සියයට 5 ක්ව පැවති බදු ආනුපාතිකය සියයට 1 දක්වා පහත දමන ලදී. මෙහි ප්‍රතිඵල වශයෙන් අයභාරය අඩුවීම ඉතාමත් සුළු වේ යයි ඇස්තමේන්තු කෙරුනි.

### 6. රජයේ සහ පළාත්පාලන ආයතනවල සේවකයින් සහ විශ්‍රාමිකයින්ට අතුරු දීමනා

කොමිසන් සභාව මගින් රාජ්‍ය සේවයේ වැටුප පිළිවෙල පිළිබඳ සම්පූර්ණ විමර්ශනයක් කෙරෙනතෙක්, රාජ්‍ය සේවකයන්ගේ හා පළාත් පාලන සේවක-යන්ගේ, පහල වැටුප් ලබන කොටස් වලට කිසියම් සහනයක් ලබා දීමේ අටියෙන් රජය මගින් අතුරු දීමනාවක් ගෙවීමට තිරණය කරන ලදී. රුපියල් 100 ට වැඩි නොවන මාසික වැටුපක් ලබන අයට මසකට රුපියල් 20/- බැගින් අතුරු දීමනාවක් ලැබෙනු ඇත. මාසික වැටුප රුපියල් 100 ට වැඩි වූ නමුත්, රුපියල් 300 ට වැඩි නොවන අයට මසකට රුපියල් 10/- බැගින් දීමනාවක් ලැබෙනු ඇත. රුපියල් 100 කට නොවැඩි මූලික විශ්‍රාම වැටුපක් ලබන වැන්දඹු-වන් ඇතුළු විශ්‍රාමිකයින්ට මසකට රුපියල් 10/ ක අතිරේක දීමනාවක් ලැබෙනු ඇත. මසකට රුපියල් 100/- ට වැඩි නමුත්, රුපියල් 300 ට අඩු විශ්‍රාම වැටුපක් ලබන අයට මසකට රුපියල් 5/-ක දීමනාවක් හිමි වනු ඇත. මෙම යෝජනා සඳහා වසරකට රුපියල් දශ ලක්‍ෂ 60 ක පමණ අමතර වියදමක් දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

### වියදම

1967/68[2] වර්ෂයෙහි සම්මත වැය එකතුව රුපියල් දශ ලක්‍ෂ 2861·7 බව ගණන් බලා තිබේ. මේ එකතුවෙන් ආවර්තන වියදම් (වැය සම්මත 1, 2, 4 සහ 6) රුපියල් දශ ලක්‍ෂ 3079·2 ක් වූයේය. ප්‍රාග්ධන වියදම් වලට වැටෙන වියදම් (වැය සම්මත 3,5 සහ 7) රුපියල් දශ ලක්‍ෂ 782·5 කි. ආවර්තන වියදම් වෙනුවෙන් සාමාන්‍යයෙන් වෙන්කරනු ලබන සියයට $2\frac{1}{2}$ ක ඌන වියදම් ප්‍රාග්ධන වැය සම්මතයන් වෙනුවෙන් කරන සියයට 15 ක ඌණ වියදම් වෙන් කිරීමෙන් පසු, මුළු වැය සම්මතය රුපියල් දශ ලක්‍ෂ 2692·4 ක් වෙතැයි බලාපොරොත්තු විය. මෙම සංඛ්‍යාව 1966/67 වර්ෂය සඳහා සම්මත වැය වන රුපියල් දශ ලක්‍ෂ 2500·0 නියම (තාවකාලික) වියදමට[3] වඩා රුපියල් දශ ලක්‍ෂ 172·4 කින් වැඩි වූ අතර, ආවර්තන වියදම් වල රුපියල් දශ ලක්‍ෂ 132·0 සහ ප්‍රාග්ධන වියදම් වල රුපියල් දශ ලක්‍ෂ 40·4 ක වැඩිවීමක් නිරූපනය කරයි.

---

1. ආදායම් ඇස්තමේන්තුවල 10 වැනි ශීර්ෂය, උපශීර්ෂ 14 යටතේ වර්ග කෙරුනි.
2. මෙම යෝජනා 1967 ඔක්තෝම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කරන ලදී
3. නිදන් අරමුදල් දායක කොටස් සහ අයභාරයෙන් (රුපියල් දශ ලක්ෂ 225·6 සෘජු රාජ්‍ය ණය ආපසු ගෙවීම් හැර.)

### වර්තන වියදම

මෙම මුදල් වර්ෂය තුල දී ආවර්තන වියදම් රුපියල් දශ ලක්ෂ 2204·8 ක් වේ යයි ඇස්තමේන්තු කොට ඇත. ආවර්තන වියදම් යටතේ එන ප්‍රාග්ධන ගිණී වෙනුවෙන් සියයට $2\frac{1}{2}$ ක ඌන වියදම් ගැලපීමෙන් සහ නිදන් අරමුදලේ දායක මුදල් මෙම මුදලෙන් අඩු කිරීමෙන් පසු ඉතිරි ආවර්තන වියදම් ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ 1967·6 ක් වූයේය. මෙය 1966/67 නියම (තාවකාලික) වියදම වන රුපියල් දශ ලක්ෂ 1,818·5 හා සැසඳේ.

1967/68 ඇස්තමේන්තු කරන ලද වර්තන වියදම (රුපියල් දශ ලක්ෂ 181·0) 1966/67 නියම වියදම් (තාවකාලික) හා සසඳන කල වැඩි වූයේ ප්‍රධාන වශයෙන්, පරිපාලනය (රුපියල් දශ ලක්ෂ 30·4) විශ්‍රාම වැටුප් (රුපියල් දශ ලක්ෂ 18·4) ආහාර පිහටාධාරය (රුපියල් දශ ලක්ෂ 24·5) ආර්ථික සේවාවන් (රුපියල් දශ ලක්ෂ 29·6) රාජ්‍ය ණය සඳහා වූ පොලිය (රුපියල් දශ ලක්ෂ 16·0) සහ සමාජ සේවාවන් (රුපියල් දශ ලක්ෂ 52·5) වශයෙන් වියදම් ඉහල යාම හේතුකොට ගෙනය.

### ප්‍රාග්ධන වියදම

1967/68 වර්ෂය සඳහා ඇස්තමේන්තුකර ඇති සම්මත කරන ලද මුළු වැය (සියයට 26 කට ආසන්නවූ) ප්‍රාග්ධන වැය සම්මතයන් වශයෙන් ගැනෙන වියදම් වෙනුවෙන් වූ රුපියල් දශ ලක්ෂ 782·5 ක වෙන් කිරීම, ඕනෑම ලිත් වර්ෂයක වෙන් කල වැඩිම ප්‍රමාණය වූ අතර, 1966/67 සඳහා වූ පූර්ව ඇස්තමේන්තු මගින් කළ වෙන් කිරීමට වඩා රුපියල් දශ ලක්ෂ 20·8 කින් වැඩි විය. සියයට 15 ක (රුපියල් දශ ලක්ෂ 117·4) ඌන වියදමකට ඉඩ දීමෙන් පසුවද, අපේක්ෂා කළ ප්‍රාග්ධන වියදම් මට්ටම, 1966/67 නියම (තාවකාලික) වියදමට වඩා රුපියල් රුපියල් දශ ලක්ෂ 40.4 කින් වැඩි විය. ආවර්තන වියදම් සම්මතයන් යටතේ එන ප්‍රාග්ධන ගිණීයන් එකතු කිරීමෙන් සහ ඌණ වියදම් සඳහා වෙන් කිරීමෙන් පසුව, ඇස්තමේන්තු කරන ලද මුලු ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 744·8 ක ප්‍රමාණයක් විය. මෙය, 1966/67 සඳහා වූ නියම (තාවකාලික) වියදමට (රුපියල්-දශ ලක්ෂ 701·5) වඩා රුපියල් දශ ලක්ෂ 43·3 ක වැඩිවීමක් නිරූපනය කළේය.

### අයවැය ලේඛනයෙන් යෝජනා කෙරුනු අභිනව විධිවිධාන

**(1) කෘෂිකර්මය**

ග්‍රාමීය ණය පිළිබඳ නව ක්‍රමයක් සකස්වූ අතර, මහ කන්නයේ සිට එය ආරම්භ වනු ඇත. අනුමත භෝග ප්‍රධාන වශයෙන් වගාවන් සඳහා, සමුපකාර සමිති වෙත ණය මුදල් සැපයීමේ කාර්‍යය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙතින් වානිජ බැංකු වෙත පවරා ගැනීම, මේ ක්‍රමය යටතේ සිදුවනු ඇත. සමුපකාර සමිති වෙත ණය මුදල් සැපයීම පිණිස අවශ්‍ය වන්නාවූ ප්‍රතිමුදල්, මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත සපයනු ඇත. මෙම භෝග වගා කිරීම සඳහා වාණිජ බැංකු විසින් ණය මුදල් දීමේ දී, අවදානම් උද්ගත වීම් නිසා, එම ණය මුදල් සහතික කිරීමට රජයට සිදුවිය. රජය වෙනුවෙන් මහ බැංකුව, මෙම ණය මුදල් පැහැර හැරීම් වලින් සියයට 75 දක්වා සහතික කරන අතර, ඉතිරි සියයට 25 හේ ශේෂය ණය මුදල් සපයන්නාවූ බැංකුව විසින් දරනු ඇත. අක්කරයක් සඳහා නිකුත් කරන ණය මුදල් ප්‍රමාණය ද රුපියල් 175 සිට රුපියල් 220 දක්වා ඉහල නංවා ඇත. නව ක්‍රමය යටතේ දෙනු ලබන මුළු ණය ප්‍රමාණය, දැනට පවත්නා වාර්ෂික මට්ටමෙන් රුපියල් දශ ලක්ෂ 33 කින් පමණ වැඩිවනු ඇතැයි බලාපොරොත්තුවනු ලැබේ.

**(2) කර්මාන්ත**

පුද්ගලික අංශයේ කර්මාන්තයන් සඳහා අනුබල දීම, නගා සිටුවීම හා සංවර්ධනය කිරීමේ නව නීතිරීති ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවේ. මෙම නීති පදනම් කරගත් කාර්මික වර්ධනයෙහි ලා නව තවත් වගකීම් දැරීම පිණිස කර්මාන්ත සංවර්ධන මණ්ඩලය ප්‍රතිසංවිධානය කරනු ඇත. මෙම සංවිධානය විසින්, ආයෝජන ප්‍රවෘත්ති මධ්‍යස්ථානයක්ද, අපනයන වර්ධන මධ්‍යස්ථානයක්ද, කාර්මික සැපයුම් නියෝජන ආයතනයක් සහ පාලන සංවර්ධන සහ ඵලදායිතා මධ්‍යස්ථානයක්ද යනු වශයෙන් නව ආයතන කිහිපයක් පිහිටුවනු ඇත. තවද, මෙමගින් නුවර සහ යාපනය දිස්ත්‍රික්කයන්හි කාර්මික ජනපද පිහිටුවීමට අදහස් කර ඇත. කර්මාන්තයන්හි නොයෙකුත් අංශයන්

වවනුවෙන් කාර්මික උපදේශක සභාවක් සහ කාර්මික මණ්ඩලයක් පිහිටුවීම සම්බන්ධයෙන් නියමිත ව්‍යවස්ථා පනවනු ඇත. මෙසේ යෝජිත නීති රීති මගින්, රජය සහ නිෂ්පාදන කර්මාන්තයන් යන දෙ අංශයෙහිම දායක මුදල් සැපයෙන්නාවූ විශේෂ කාර්මික වර්ධන අරමුදලක්ද පිහිටුවීමට අපේක්‍ෂා කෙරේ.

**(3) ණය හා ඉතිරි කිරීමේ ආයතන ප්‍රතිසංවිධානය කිරීම.**

(අ) වර්ෂ 1961 [1] මුදල් පනතින් විදේශීය බැංකු වෙත පැණවුනු සීමා කිරීම් අවලංගු කිරීමට ඇති රජයේ අදහස පසුගිය අයවැය ලේඛන දෙක මගින් ප්‍රකාශ කර තිබුණි. විදේශීය බැංකු සමග දැනට පැවැත්වීගෙන යන සාකච්ඡාවන් ඉක්මණින් සමාප්ත කිරීමට බලාපොරොත්තු වන අතර, මේ කාරණය සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි විසඳීමකට පැමිණීමට රජය බලාපොරොත්තු වේ.

(ආ) මහජන බැංකු කොමිසමේ නිර්දේශයන්ට අනුකූලව, ණය බේරීමේ යෝජනා ක්‍රමය මහජන බැංකුවෙන් රාජ්‍ය උගස් බැංකුව වෙත පැවරීම පිණිස ටික කලකින් ව්‍යවස්ථාවක් ඉදිරිපත් කෙරෙනු ඇත.

(ඇ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේ බැංකුව සහ ජාතික ව්‍යාපාරය, ඒකාබද්ධ කොට, ජාතික ඉතිරි කිරීමේ බැංකුවක් බවට පත් කිරීමට අවශ්‍ය නීති රීති ඉදිරිපත් කෙරෙනු ඇත.

(ඈ) නුදුරු අනාගතයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පිළියෙල කර ඇති කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සංයුක්ත මණ්ඩල පණත සහ රාජ්‍ය උකස් බැංකු පණතෙහි සංශෝධනයන් මගින් මෙම ආයතනයන්හි ක්‍රියා කාරිත්වය පුළුල් කිරීමට අදහස් කර ඇත.

(ඉ) මහජන බැංකු කොමිසමේ නිර්දේශයන්ට අනුකූලව මහජන බැංකු පණත සංශෝධනය කිරීමට බලාපොරොත්තු වෙයි.

(ඊ) ලංකා බැංකුවේ ක්‍රියාකාරිත්වය පරීක්‍ෂා කිරීමට සහ දිවයිනේ ආර්ථික සංවර්ධනය[2] සඳහා මෙම ආයතනය වැඩියෙන් සහාය කර ගැනීම සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවක් පත් කිරීමට නියමිතය

**(4) බදු කොමිසමේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.**

බදු ව්‍යුහය සවිස්තරාත්මක ලෙස හැදෑරීමෙන් පසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද බදු කොමිසම විසින් ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කොට ඇත. එම නිර්දේශ සැලකිල්ලට භාජන වෙමින් පවතියි.

---

1 පණත පාර්ලිමේන්තුව ඉදිරියේ තබා ඇති නිසා.

2. පහත සඳහන් අරමුණු සඳහා පරීක්‍ෂණ කොමිසමක් පත්කර ඇති නිසා.

(1) පහත දැක්වෙන කරුණු පිළිබඳ විශේෂ සම්බන්ධයක් ඇතිව 1961 ජූලි 27 වන දින ආරම්භව, 1968 පෙබරවාරි 29 වැනි දින අවසන් වන කාලසීමාව තුළ (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා බැංකුවෙහි ක්‍රියාකාරිත්වය හා පරිපාලනය පිළිබඳ පරීක්ෂා කොට වාර්තා කිරීම–

(අ) බැංකු ව්‍යාපාරයෙහි සහ බැංකුව ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත විධිවිධාන වලින් අවසර දෙන ලබන සීමා ඇතුළත, ලංකාවේ ආර්ථික සංවර්ධනයට බැංකු සහාය වී ඇති ප්‍රමාණය සහ වෙළෙඳ, කාර්මික සහ කෘෂිකාර්මික ව්‍යාපාරයන් දියුණු කිරීම සඳහා ණය, අයිරා, අණකර හෝ වෙනත් අනුග්‍රහයක් මගින් බැංකුව විසින් ලංකාවෙහි පුරවැසියන්ට මුදල් ආධාර සලස්වා ඇති ප්‍රමාණය;

(ආ) ප්‍රමාණවත් ඇප හෝ ප්‍රමාණවත් ආරක්ෂා සංවිධාන නොමැතිව හෝ බැංකු ව්‍යාපාරයෙහි පිළිගත් මූලධර්ම වලට පටහැනිව, යම් තැනැත්තකුට හෝ ආයතනයකට යම් ණයක්, අයිරා අණකරයක් හො වෙනත් අනුග්‍රහයක් බැංකුව විසින් ප්‍රධානය කර තිබේ ද යනවග;

(ඇ) බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයෙහි යම් සාමාජිකයකු හෝ එහි යම් නිලධරයකු හෝ සේවකයකු බැංකුවෙහි යහපතට හානියක් වන යම් ආකාරයකින් නියම වශයෙන් හෝ අනියම් වශයෙන් ක්‍රියාකර යන වග; සහ

(2) ඉහත කී කරුණු සම්බන්ධයෙන් සහ කොමසාරිස්වරුන් වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි ඉහත කී කරුණු වලට සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගිකවූ වෙනයම් කරුණක් සම්බන්ධයෙන් සහ විශේෂයෙන්, ලාංකික රටවැසියන්ගේ ණය පිළිබඳ අවශ්‍යතාවයන් ප්‍රමාණවත් ලෙස පිරිමැසීමට සහ ලංකාවේ ආර්ථික සංවර්ධනය ඉක්මන් කිරීමෙහි ලා වඩා ප්‍රබල ක්‍රියා මාර්ගයක් ගෙන යාමට බැංකුවට හැකිවන පරිදි, බැංකුවෙහි කටයුතු කාර්යක්ෂම ලෙසත්, පහසු ලෙසත් කරගෙන යාම පිණිස ගතයුතු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔවුන් විසින් සැලකිය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම.

(5) **රාජ්‍ය සේවය**

(අ) ප්‍රාග්ධන සහ ආවර්තන වියදම් වෙනුවෙන් වෙන්කර ඇති විශාල මුදල් ප්‍රමාණය මගින් ස්ථිර වශයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම පිණිස ලබන වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 15 ක වියදමින් 5,400 පමණ අතිරේක සේවක පිරිසක් බඳවා ගැනීමට තීරණය විය. මෙයින් වැඩි කොටසක් අධ්‍යාපන, කෘෂිකර්මාන්ත, තැපැල් සහ විදුලි පණිවුඩ අමාත්‍යාංශය අතරේ බෙදා හැරියේය.

(ආ) රජයේ ගිණුම් කටයුතු වල තාක්ෂය, පරිපාලන ගිණුම් කටයුතු වලට විශේෂත්වයක් දක්වමින්, මූල්‍ය පිළිවෙත් සීඝ්‍රයෙන් වර්ධනය කිරීමට රජය බලාපොරොත්තු වේ. රජයේ ගණකාධිකාරිවරුන්ගේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන් සඳහා චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහාය ඇතිව, මහා භාණ්ඩාගාරය විසින් ගණකාධිකරණය පිළිබඳ විශේෂ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. රාජ්‍ය සේවයේ සිටින දියුණු වන අන්දමේ තරුණ නිලධාරීන් චාර්ටඩ් ගණකාධිකාරිවරුන් වශයෙන් පුහුණු කිරීමට ද ක්‍රියාකර ඇත. මෙම වැඩ පිළිවෙලවල් දෙකෙහි ප්‍රතිඵලය වනු ඇත්තේ, රජයේ විශාල ආයෝජන කටයුතු සූක්ෂම අන්දමින් පරීක්ෂා කිරීමට සුදුසුකම් ඇති ගණකාධිකාරීන් පිරිසක් රජයට හිමිවීමය.

(ඇ) ලංකා පරිපාලන සේවය, ඒකාබද්ධ ඉංජිනේරු සහ විද්‍යාත්මක සේවාවන් පිහිටුවීම, සහ පරිපාලන ප්‍රතිසංවිධානයන් පිළිබඳ පොදු පැනයන් සම්බන්ධයෙන් පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා, කාරක සභා කිහිපයක් පත් කිරීම පිළිබඳව, පසුගිය අයවැය වාර්තාවේ සඳහන් කෙරුනි. මේ සෑම කාරක සභාවක් විසින්ම ඔවුන්ගේ කාර්‍යයන් අවසන් කර ඇති අතර, පරිපාලන සේවාව සහ සාමාන්‍ය පරිපාලන ප්‍රතිසංවිධානයන් සම්බන්ධයෙන් කළ නිර්දේශයන් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. මේ අතර, ඒකාබද්ධ ඉංජිනේරු සහ විද්‍යාත්මක කාරක මණ්ඩලයක් පිහිටුවීමේ ප්‍රශ්ණය කෙරෙහි විශේෂ සැලකිල්ලක් ලැබී ඇත.

**අවප්‍රමාණ කිරීමෙන් පසු ගන්නා ලද විධිවිධාන පිළිබඳ කෙටි විස්තරය** - මුදල් නීති පණතේ 69 (2) වැනි ඡෙදය යටතේ,[1] 1967 නොවැම්බර් 22 වැනිදා රජය විසින් ලංකා රුපියලේ සම මිල සියයට 20 කින් වෙනස් කරන ලදී.

ඉහළ යන මිල මගින් ජීවන වියදමට වන බලපෑම හීන කිරීමේ අදහසින්, රුපියල අවප්‍රමාණ කිරීමත් සමගම, පහත දැක්වෙන විධි විධානයන් එක විට අනුගමනය කිරීමට රජය තීරණය කළේය.

1. අවප්‍රමාණය කිරීම නිසා රජය විසින් සහල් ආනයනය සඳහා ගෙවිය යුතු රුපියල් මිල වැඩි වුවද, සතිපතා බෙදන්නා වූ සහල් සලාකය නොකඩවාම නොමිලයේ සපයනවා ඇත.

2. රජය විසින් ගෙන්වන පරිප්පු වල රුපියල් මිල ඉහළ යාම පාරිභෝගිකයා වෙත නො පවරා, රජය විසින්ම විඳ දරාගනු ඇත.

3. ලංකාවේ දේශීය වී නිෂ්පාදනය වැඩි කිරීමට තවත් අනුබලයක් වශයෙන්, සහල් ආනයනය අඩු කරයි. 1967[2] දෙසැම්බර් 1 වැනිදා සිට වී සහතික මිල රුපියල් 2 කින් එනම්, බුසල රුපියල් 12/- සිට රුපියල් 14/- දක්වා වැඩි කෙරුනි.

---

1. 1967 නොවැම්බර් 22 වැනි දින අංක 14775/17 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය.
2. 1967 නොවැම්බර් 25 වැනි දින අංක 14776/5 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.

4. පහළ මට්ටමේ පඩි ලබන ගණයට වැටෙන රජයේ සේවකයින් සහ පළාත් පාලන සේවකයින් වෙත සහනයක් ලබාදීමේ අදහසින්, 1967 දෙසැම්බර් 1 වැනිදා සිට රුපියල් 300/- කට වැඩි නොවන මූලික විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමිකයින්ට මසකට රුපියල් 10/- ක දීමනාවක් ගෙවීමට තීරණය කළේය. මෙම දීමනාව අයවැය ලේඛනයෙන් රජය ලබාදුන් රුපියල් 10·00 සිට රුපියල් 20·00 දක්වා වෙනස්වන අතුරු දීමනාවට අමතරව ය.

අයභාර මාගී

අවප්‍රමාණය කිරීමේ හේතුවෙන් අපනයනිකයින් වෙත එකතු වූ අතිරේක ආදායම් වලින් කොටසක් ලබා ගැනීමේ අපියෙන්, අපනයන තීරුබදු සම්බන්ධයෙන් සුදුසු වූ ගැලපීම් කරනු ලැබිය. මෙම අයබදු ගැලපීමේදී, පහත සඳහන් කර ඇති පරිදි අපනයන භාණ්ඩවල පවත්නා වූ ද, ඉදිරියට බලාපොරොත්තු විය හැකි වූ ද, මිල ගණන් සහ නිෂ්පාදන වියදම ගැන සැළකිල්ල යොමු කරන ලද්දේ, එමගින්, අතිරේක ආදායම්හි සාධාරණ ව්‍යාප්තියක් ඇති කිරීමට ය.

(අ) අපනයන තීරු බද්ද ශත 5 කින් වැඩි වීමෙන් තේ රාත්තලක තීරුබද්ද ශත 40 කට පත් විය.[1] 1967/68 මුදල් වර්ෂයේ දී රජයට රුපියල් දශ ලක්ෂ 45 ක වියදමක් වෙතැයි බලාපොරොත්තු වූ තේ අපනයන ප්‍රතිදාන ක්‍රමය ඉවත් කරනු ලැබීය.[2]

(ආ) දැනට පවත්නා අනුක්‍රම පරිමාණයට, තීරු බද්දට අතිරේක වශයෙන් රබර් රාත්තලකට ශත 3 ක නව තීරු බද්දක් පැනවුනි.[3]

(ඇ) පොල් නිෂ්පාදිතයන් සම්බන්ධයෙන් වූ අනුක්‍රම පරිමාණයේ තීරු බද්ද සංශෝධනය කරනු ලැබුයේ පොල් නිෂ්පාදිතයන් වෙනුවෙන් වූ මිල ඉහළ- යෑම් වලින් සියයට 50 ක කිට්ටු ප්‍රමාණයක් මකාලීමටය.[4]

(ඉ) කොකෝවා සහ කුරුඳු පොතු සම්බන්ධ තීරු බදු වැඩි කරන ලදී; කොකෝවා සම්බන්ධයෙන් තීරු බද්ද රාත්තල් සියයකට රුපියල් 25 කින් වැඩි කර, රුපියල් 30 දක්වා ද, කුරුඳු පොතු සම්බන්ධයෙන් රාත්තල ශත 35 කින් වැඩිකර ශත 50 දක්වා ද ඉහළ නැංවිය.[4]

සමහර භාණ්ඩයන් ගොඩ බෑමේ වියදම කොටස් වශයෙන් දැරීමට පහත සඳහන් මාර්ගයන් ඉදිරිපත් කෙරුණි.

(අ) සුදු සීනි වල සිල්ලර මිල, රාත්තලට ශත 5 කින් වැඩි කිරීම.[5]

(ආ) පිටිවල සිල්ලර මිල, රාත්තලට ශත 5 කින් වැඩි කිරීම.[6]

(ඇ) 67-11-23 සිට ඇතැම් ඛනිජ තෙල් නිෂ්පාදනයන් ගේ මිල වැඩි කිරීම.[7]

රුපියල් අවප්‍රමාණ කිරීමෙන් සහ එම අවස්ථාවේ දී ගනු ලැබූ පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ආවර්තන හා ප්‍රාග්ධන වියදම් වල වැඩිවීම්, අයභාරයේ වැඩිවීම් වලට වඩා, තරමක් වැඩි විය හැක. පවත්නා මුදල් වර්ෂය සඳහා මුලින් ඇස්තමේන්තු කරන ලද රුපියල් දශ ලක්ෂ 768·1 අයවැය හිඟය මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩි විය හැක.

---

1. 1967 නොවැම්බර් 22 වැනි දින අංක 14775/17 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
2. 1968 ජනවාරි 2 වැනිදයින් පටන් ගෙන කොළඹ තේ වෙන්දේසි වල විකුණනු ලැබූ පහත සහ මධ්‍යම වර්ගයේ තේ සෑම රාත්ලකට ම ශත 5 ක් ගෙවිය යුතු පරිදි සංශෝධිත තේ ප්‍රතිදානය නැවත රජය විසින් ඉදිරිපත් කරන ලදී.
3. 1967 නොවැම්බර් 23 වැනි දින අංක 14776/17 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
4. 1967 නොවැම්බර් 23 වැනි දින අංක 14775/2 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සහ 1967 නොවැම්බර් 22 වැනි දින අංක 14775/17 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
5. 1967 නොවැම්බර් 23 දින අංක 14776/3 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
6. 1967 නොවැම්බර් 23 වෙනි දින අංක 14776/3 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
7. 67.11.23 වැනි දින ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව මගින් නිකුත් කරන ලද පුවත් පත් නිවේදනය.